සැ. යු. -2009.031.272 දින පළ වූ අංක 1,595 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,596 - 2009 අප්‍රේල් මස 03 වැනි සිකුරාදා - 2009.04.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 432 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 432 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 436 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අප්‍රේල් මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 මාර්තු මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

DRF/21/RECT/2723.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2008 සැප්තැම්බර් මස 15 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (තාවකාලික මේජර්) රුවන් සුජීව ගුණසේකර, ආර්එස්පී ශ්‍රීලංසිරෙ (නි/61271)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

04-155

DRF/21/RECT/2681.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2008 අගෝස්තු මස 15 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් වික්‍රමආරච්චිගේ ලලිත් ප්‍රියන්ත වික්‍රමආරච්චි, ගරෙ (නි/63697)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

04-156

# ආණ්ඩුවේ නිවේදන

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත, 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

02. මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාල ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2009 මාර්තු මස 17 වැනි දින,
අංක 428/11,
වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| ඉල්ලුම්පත් අංක | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (01) 41109 | ගල්කරාවුන්ගේ ජයලාල් සමරක්කොඩි මයා, අංක 406, මැදගලතුර, රත්නපුර | කැප්පෙටියාගොඩ විතානගේ ඩේලින් නෝනා මිය, සුගුණපුර, මැද ගලතුර, රත්නපුර |
| (02) 41111 | ගොරකානගේ ඩොනල්ඩ් සිල්වා මයා, අංක 88/5, වටරප්පල පටුමග, ගල්කිස්ස | ජෙයිනුදීන් මොහොමඩ් නවාස් මයා, බිඳුනුවැව, බණ්ඩාරවෙල |
| (03) 41121 | දිසානායක මුදියන්සේලාගේ සමරවීර මයා, මීගහරාව, කරඳගහමඩ, අරාව | දිසානායක මුදියන්සේලාගේ ගුණරත්න බණ්ඩා මයා, කැන්දවත්තේ ගෙදර, කෝල්ගොඩ, පිටමාරුව |
| (04) 41122 | 1. තුවාන් ශාමි නූර් මයා,<br>2. නූරුල් සූඩා නූර් මිය, අංක 118/1, කිව් පාර, කොළඹ 02 | කංකානමගේ සෝමපාල එදිරිසිංහ මයා, අංක 56/12, කෝන්ගහවත්ත පාර, කිරිබත්ගොඩ. |
| (05) 41137 | මාරප්පුලිගේ දයාවතී මිය, අංක 27, කුරුඳුවත්ත, ඉසදීන් නගරය, මාතර | මාරප්පුලිගේ මාලනී මිය, වසන්තා, කරමැටිය, කිරම |
| (06) 41139 | ඇඹුල්දෙනියේ දෝන අශෝකා මිය, අංක 24/1, ඊරියගහකුඹුර පිටිපන උතුර, හෝමාගම | වන්නිආරච්චිගේ ලලිතා උක්වත්ත මිය, අංක 68/ඒ, පිටිපන උතුර, හෝමාගම |
| (07) 41152 | යටගම ගමගේ සුරසුමන ප්‍රසාද මයා, අංක 209, ගම්පොල පාර, නාවලපිටිය | අතුලුවගේ විමලාවතී මිය, අංක 121/1, ගම්පොල පාර, නාවලපිටිය |
| (08) 41170 | 1. වියන්නලාගේ අනුෂ්ක ගයාන් තිලකරත්න මයා,<br>2. වියන්නලාගේ සිසිලින් මිය, අංක ඊ 65/1, පොල්වත්තේ ගෙදර, මැදගොඩ, වරකාපොල | හෙරනායක මුදියන්සේලාගේ ආරියදාස විජයවර්ධන මයා, අගුරුවැල්ල පාර, අංක 83ඒ, හොරගොල්ල, වරකාපොල |
| (09) 41191 | රාජපක්ෂ විදානලාගේ සිරිසේන මාය, තක්සලා, කුඹල්වෙල ඇල්ල. | රත්නහලුගේ සුගතදාස මයා, අංක 28, බණ්ඩාරනායක මාවත, බදුල්ල |

04-101

---

### ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - වැලිමඩ

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කන්දෙඇල ව්‍යාපාරයේ මහ කන්නය - 2007/2008 මහ කන්න රැස්වීම් වාර්තාව

කැප්පෙටිපොල වාරිමාර්ග කාර්යාලයේ දී 2008.11.22 වැනි දින පවත්වන ලද කන්න රැස්වීමේදී පහත සඳහන් තීරණ ගන්නා ලදී.

| | දිවිරුම්වෙල | පුරංවෙල | ගවරම්මාන | කොහිලගොල්ල | අළුත්ඇල |
|---|---|---|---|---|---|
| 1. බෝග වර්ගය | වී | වී/එළවළු | වී/එළවළු | වී | වී/අතිරේක බෝග |
| 2. වැට කඩොළු බැඳීම | 2008.12.01 | 2008.12.01ට පෙර | 2008.12.01ට පෙර | 2008.12.01ට පෙර | 2008.12.01ට පෙර |
| 3. ඇළ වේලි ශුද්ධ කිරීම | 2008.12.10ට පෙර | 2008.12.10ට පෙර | 2008.12.10ට පෙර | 2008.12.05ට පෙර | 2008.12.15ට පෙර |

| | දිවුරුම්වෙල වී | පුරංවෙල වී/එළවළු | ගවරම්මාන වී/එළවළු | කොහිලගොල්ල වී | අළුත්ඇල වී/අතිරේක බෝග |
|---|---|---|---|---|---|
| 4. ප්‍රථම ජල මුරය නිකුත් කිරීම | 2008.12.15 | 2008.12.15 | 2008.12.15 | 2008.12.15 | 2008.12.20 |
| 5. පැල සිටුවා අවසන් කරන දිනය | 2009.01.15 | 2009.01.15 | 2009.01.15 | 2009.01.20 | 2009.01.20 |
| 6. අවසන් ජල මුරය නිකුත් කරන දිනය | 2009.05.31 | 2009.05.31 | 2009.05.25 | 2009.05.15 | 2009.05.31 |

07. නිවෙස් වලින් ඉවත් කරන අපද්‍රව්‍ය ඇළ මාර්ග වලට යොමු කරන්නන් පිළිබඳව ලේඛණයක් ලබා ගෙන ඒ පිළිබඳ කටයුතු කිරීමට තීරණය විය.
08. ජලය නිකුත් කරන අවස්ථාවේ වක්කඩ මුර කිරීම සඳහා ජල පාලකට අමතරව ගොවීන්ගේ සහය ලබා ගැනීමට වැඩ පිළිවෙලක් සැකසීමට තීරණය විය.
09. පුරන්වෙල ගොවි සංවිධානයට අයත් කොටසේ කුඹුරු ඉඩමක් ගොඩ කර නිවසක් ඉදිකර ඇති බවත් ඒ පිළිබඳ ගොවිජන සේවා සහකාර කොමසාරිස්තුමා දැනුවත් කිරීමට තීරණය විය.
10. මීට අමතරව කන්දඇළ ව්‍යාපාරයේ සියළුම ගොවි සංවිධාන සාමාජිකයින් හා අනවසර වගා කරුවන් සියල්ල ඒකරාශි කරන්නා රැස්වීම් තීරණ දැනුම් දීම සඳහා රැස්වීමක් සංවිධානය කරන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමා විසින් කැප්පෙටිපොළ ප්‍රදේශය භාර කෘෂිකර්ම පර්යේෂණ හා නිශ්පාදන සහකාරට උපදෙස් දෙන ලදී. ඒ සඳහා 2008.12.01 දින සිට 2008.12.10 දක්වා දිනයක් යොදා ගන්නා ලෙස දැනුම් දෙන ලදී.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2009 මාර්තු මස 12 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-26

---

## වැලිමඩ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹේවෙල ව්‍යාපාරයේ මහ කන්නය - 2007/2008 මහ කන්න රැස්වීම් වාර්තාව

අඹේවෙල වාරිමාර්ග කාර්යලයේ දී 2008.11.24 වැනි දින පවත්වන ලද මහ කන්න රැස්වීමේ දී පහත සඳහන් තිරණ ගන්නා ලදී.

01. වගා කරන බෝගය හා බිම් ප්‍රමාණය

| | | ගොවි සංවිධානයේ නම | | |
|---|---|---|---|---|
| බෝගය | වැලිබිස්සේවෙල ගොවි සංවිධානය | අඹගස්දේව ගොවි සංවිධානය | ශිඹිලියගොල්ල ගොවි සංවිධානය | තෙන්නකෝන්වෙල ගොවි සංවිධානය |
| වී | අක්කර 13 | අක්කර 15 | අක්කර 665 | අක්කර 65 |
| එළවළු | අක්කර 250 | අක්කර 160 | අක්කර 300 | අක්කර 200 |

02. ඇළ වේලි ශුද්ධ කර අවසන් කරන දිනය - 2009.11.30ට පෙර
03. ප්‍රථම ජල මුරය නිකුත් කරන දිනය - 2008.12.05
04. බෝග වර්ගය - වී/එළවළු
05. වපුරා හෝ පැල සිටුවා අවසන් කරන දිනය - 2009.01.15
06. අවසන් ජල මුරය නිකුත් කරන දිනය - 2009.04.30
07. ඇළ වේලි ශුද්ධ නොකරන්නන් සඳහා දිනකට රු. 500ක මුදලක් දඩ මුදලක් ලෙස තීරණය විය. (වර්ග මීටර් 1ක් සඳහා රු. 50කි)
08. අඹේවෙල ව්‍යාපාරයට අයත් ගොවීන්ගේ ගොඩ ඉඩම් සඳහා ද පොහොර සහනාධාරය ලබා දෙන ලෙස ගොවීන් විසින් ඉල්ලීම් කරන ලදී. මෙම ඉල්ලීම දිස්ත්‍රික් කෘෂි කාර්ම කමිටුවට ඉදිරිපත් කිරීමටත් තීරණය විය.
09. ඇළ සංරක්ෂණය සඳහා වැඩ පිළිවෙලක් යොදා ගැනීමටත් ඒ පිළිබඳ සාකච්ඡා කර ගැනීමට ගොවි සංවිධාන හා අනවසර වගාකරුවන් ඒකාරාශි වී සාකච්ඡා කිරීමට තීරණය විය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2009 මාර්තු මස 12 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-24

## ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය - වැලිමඩ

### වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහඑළිය ව්‍යාපාරයේ මහ කන්න රැස්වීම් වාර්තාව 2007/2008

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහඑළිය ව්‍යාපාරයේ 2007/2008 මහකන්න රැස්වීම 2008.11.28 වැනි දින පිටපොල ප්‍රජා ශාලාවේ දී පවත්වන ලදී. එහිදී පහත සඳහන් තීරණ ගන්නා ලදී :

| | | | |
|---|---|---|---|
| 01. | වගා කරන බෝග වර්ගය | : | වී/එළවළු |
| 02. | වගා කරන මුළු බිම් ප්‍රමාණය | : | අක්කර 540 (රජයට ගොවිපල අක්කර 120 ද ඇතුළත්ව) |
| 03. | ඇල වේලි ශුද්ධ කර අවසන් කරන දිනය | : | 2008.12.10 ට පෙර |
| 04. | ප්‍රථම ජල මුරය නිකුත් කරන දිනය | : | 2008.12.20 |
| 05. | වපුරා හෝ පැල සිටුවා අවසන් කරන දිනය | : | 2009.03.31 |
| 06. | තවාන් දැමීම - පුරංවෙල දියලඅරාව | : | 2008.12.20 |
| | පිටපොල අනෙකුත් කොටස් | : | 2008.12.25න් පසුව |
| | හිත්නාරංගොල්ල | : | 2008.12.25න් පසුව |
| 07. | අවසන් ජල මුරය නිකුත් කරන දිනය | : | 2009.06.15 |

08. ඔහිය ඇල හා කෙත් ඇල රක්ෂිතය ආරක්ෂා කිරීම සඳහා කෙත් ඇලේ කණ්ඩිය අඩි 03ක ප්‍රමාණයක් තැබීමට තීරණය විය.
09. ඉම නියරයට වල් නාශක යෙදීම නතර කිරීමට තීරණය විය.
10. ඇල වේලි ශුද්ධ නොකරන්නන් සඳහා පොහොර සහනාධාරය ලබා නොදීමට කටයුතු කිරීමට තීරණය විය.
11. පිදුරු ගිණි තැබීම වැලැක්වීමට තීරණය විය.
12. ඇල වේලි ශුද්ධ නොකරන්නන් සඳහා දඩ මුදල ලෙස වී පැළයකට රු. 500ක් අය කිරීමට තිරණය විය.
13. ප්‍රධාන ඇල ශුද්ධ කිරීමට 2008.12.04 දිනය තීරණය විය.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2009 මාර්තු මස 11 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-25

---

එල්. ඩී. බී. 94/47 111.

## (269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත

### 6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වැනි අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) සහ 21(2)(ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මා විසින්, 1962 ජූලි මස 27 වැනි දින අංක 13230 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද කැළණිය රජමහා විහාර පූජා භූමිය සම්බන්ධයෙන් ඉහත කී ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය යටතේ කරන ලද නියමය පහත දැක්වෙන පරිදි මේ නියමය මගින් සංශෝධනය කරනු ලැබේ.

(1) එකී නියමයේ උපලේඛනයේ "1 වැනි කොටස" යන වචනය සහ ඉලක්කම එහි "උපලේඛනය" යන වචනයට ඉක්බිතිව එකතු කිරීමෙන්,

(2) එකී උපලේඛනයේ "1 වැනි කොටස" ට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස ආදේශ කිරීමෙන්,

#### 11 වැනි කොටස

2008.01.09 වැනි දින අංක KLN/2007/410 දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැළණිමුල්ල ගමේ පිහිටි පහත දැක්වෙන පරිදි මායිම් වූ මුලු බිම් ප්‍රදේශය :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය, ඒ. පතිරණ යන අයට අයත් ජෙටාවත්ත ඉඩමේ පාර, ඒ. ඩී. බණ්ඩාරනායක සහ අජිත් උඩුගොඩ යන අයට අයත් වලව්වත්ත ඉඩම. |
| *නැගෙනහිරට* | : | ඒ. ඩී. බණ්ඩාරනායකට අයත් වලව්වත්ත ඉඩම සහ මාර්ගය, |
| *දකුණට* | : | මාර්ගය, |
| *බටහිරට* | : | කැළණි ගඟ සහ මාර්ගය. |

(3) 11 වැනි කොටස සමන්විත ඉඩම් ප්‍රදේශය ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත්, උපලේඛනයේ 1 වැනි සහ 11 වැනි කොටස් එක්ව කැළණිය රජමහා විහාර පූජා භූමිය සමන්විත විය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ, සහ

(4) එහි සඳහන් 1 සහ 11 වැනි කොටස් වල ලකුණු කර ඇති ඉඩම් ප්‍රදේශය ඒකාබද්ධ කිරීම මගින් සමස්ථ භූමි ප්‍රදේශය ම කැළණිය රජමහා විහාර පූජා භූමිය ලෙස දළ සැළසුම් යෝජනා ක්‍රමයක් සකස් කරනු ලැබිය යුතු බවට විධාන කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන සහ පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2009 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

04-21

---

පීආර්/1/4/68.

## විදේශ කටයුතු අමාත්‍යාංශය

ගරු විදේශ කටයුතු ඇමතිතුමන් විසින් 2009 ජනවාරි මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ නියුතු කිර්ගීස් ජනරජයේ නිර්වේතනික කොන්සල් වශයෙන් හේමසිරි ප්‍රනාන්දු මහතා සතුටින් පිළිගෙන ඇත.

පාලිත ටී. බී. කොහොන,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2009 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ 01,
ජනරජ ගොඩනැගිල්ලේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

04-165

**වන්දනා ආඥාපනත**

ගොඩපිටිය මුස්ලිම් උත්සවය - 2009

මාතර දිස්ත්‍රික්කයේ, අකුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩපිටිය පෝරුවේ (අකුරැස්ස-ගොඩපිටිය) "මොහියදීන් මුස්ලිම් දේවස්ථානයේ" වාර්ෂික ආගමික උත්සවය 2009 අප්‍රේල් මස 01 වැනි දින ආරම්භ වී 2009 අප්‍රේල් 12 වැනි දින අවසන් කරන බව (175 අධිකාරය) වන්දනා ආඥාපනත යටතේ සකස් කර, 1954 ජනවාරි මස 08 වැනි දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසිවල 3 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

1954 ජනවාරි මස 08 වැනි දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉහත පැවැත්වෙන කාලය තුළ දී එකී රෙගුලාසි වල සඳහන් එහිම උපඡේදයෙන් විස්තර වන "කඳවුරු තුළ" ක්‍රියාත්මක වේ.

අයි. එස්. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
අකුරලිය.

2009 මාර්තු මස 12 වැනි දින,
අකුරලිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

04-88

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 22581 හා 2005.04.01 දින ද 22935 හා 2005.08.01 දින ද අංක 26088 හා 2008.08.07 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර තිබෙන, ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 35594 දරන හා ලියාපදිංචි කාර්යාලය නුගේගොඩ පිහිටා තිබෙන සමාගමක් වන "අයෝරා කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ්" නමැති සමාගම විසින් සහ මනෝජා දිල්සිරි ද අල්විස් දිසානායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී උකස් බැඳුම්කර මත එකී අයෝරා කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් සහ මනෝජා දිල්සිරි ද අල්විස් දිසානායක යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් තිස්නව ලක්ෂ අනූතුන් දහස් පනස් නවයකුත් ශත තිස්හතරක (රු. 39,93,059.34) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ එම බැංකු පහසුකමට අදාල විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද රුපියල් පනස් ලක්ෂ අසූඑක් දහස් එකසිය අනූනවයකුත් ශත විසි නවයක (රු. 50,81,199.29) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් ලක්ෂයක් (රු. 30,00,000) සඳහා වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් පොළිය ද රුපියල් දහහත් ලක්ෂ විසි දෙදහස් දෙසීය විස්සක් (රු. 17,22,220) සඳහා වර්ෂයකට සියයට තිස් එකකුත් දශම හයයි හතර (31.64%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස්නව ලක්ෂ අනූතුන් දහස් පනස් නවයකුත් ශත තිස් හතරක (රු. 39,93,059.34) මුදල සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ එම බැංකු පහසුකමට අදාල විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද රුපියල් පනස් ලක්ෂ අසූඑක් දහස් එකසිය අනූනවයකුත් ශත විසි නවයක (රු. 50,81,199.29) මුදලක් සහ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් ලක්ෂයක් (රු. 30,00,000) සඳහා වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් පොළිය ද රුපියල් දහහත් ලක්ෂ විසි දෙදහස් දෙසීය විස්සක් (රු. 17,22,220) සඳහා වර්ෂයකට සියයට තිස් එකකුත් දශම හයයි හතර (31.64%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ, විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අය කර ගැනීම සඳහා ඉහත කී අංක 22581, 22935 සහ 26088 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 22581, 22935 හා 26088 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ මහ නගර සභා සීමාව ඇතුළත බැන්ඩියමුල්ලේ පිහිටි කොළඹ පාර, වරිපනම් අංක 350 හා 352 දරන දෙල්ගහලන්ද නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු කේ. ඒ. පී. කස්තුරිරත්න විසින් මැන සාදන ලද අංක 3991 හා 2004 සැප්තැම්බර් මස 01 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරටː කොළඹ පාර ද, නැගෙනහිරට : කොළඹ පාර වරිපනම් අංක 360 දරන පරිශ්‍රය ද, දකුණට : සියනෑ පාරේ සිට නිවෙස්වලට යන පාර ද, බස්නාහිරටː කොළඹ පාර වරිපනම් අංක 348 දරන පරිශ්‍රය සහ සියනෑ පාර වරිපනම් අංක 05 දරන පරිශ්‍රය ද යන මායිම් ඇතුළත පර්චස් විසි හයක් (අ. 0, රූ. 0, පර්. 26) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

එල්. ජී. පෙරේරා,
කළමණාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරි.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

04-158

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 771 හා 2007 ජූලි මස 27 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "විජේසූරිය කෙමිකල්ස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයන් ලෙස හිඟුරක්ගොඩ ව්‍යාපාරය කරගෙන යන (මෙහි මින් ඉදිරියට "හවුල්කරුවන් " යනුවෙන් සඳහන් කරනු ලබන) විජේසූරිය ආරච්චිලාගේ සුනිල් විජේසූරිය සහ විජේසූරිය ආරච්චිලාගේ ධර්මදාස යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 771 දරන උකස් බැඳුම්කරය මත එකී විජේසූරිය ආරච්චිලාගේ සුනිල් විජේසූරිය සහ විජේසූරිය ආරච්චිලාගේ ධර්මදාස යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් පන් ලක්ෂ විසි දහස් හාරසිය හැත්තෑ පහකුත් ශත තිස් නවයක (රු. 5,20,475.39) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාර ලක්ෂ හතලිස් එක් දහස් දෙසීය විසි එකකුත් ශත තිස් තුනක් (රු. 4,41,221.33) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් පන් ලක්ෂ විසි දහස් හාරසිය හැත්තෑ පහකුත් ශත තිස් නවයක (රු. 5,20,475.39) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාර ලක්ෂ හතලිස් එක් දහස් දෙසීය විසි එකකුත් ශත තිස් තුනක් (රු. 4,41,221.33) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහළ අනුපාතිකයක් මත ගනන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 771 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### *අංක 771 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

උතුරු මැද පළාතේ, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිංහල පත්තුවේ/කෝරළයේ, අංක 63 යෝධ ඇල, බටුකොටුව ග්‍රාමයේ පිහිටි අ. ජා. පි. පො. 153 පිඹුරේ ලොට් අංක 192 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන උතුරට : අංක 193 දරන උස් බිම ද, නැගෙනහිරට : අංක 48 දරන උස් බිම ද, දකුණට : අංක 191 ද, බස්නාහිරට : අංක 47 1/2 ද යන මායිම් ඇතුළත අක්කර දෙකකුත් රූඩ් එකකුත් පර්චස් විසි දෙකක් (අ. 2, රූ. 1, පර්. 22) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ඉහත සඳහන් ඉඩම මෙහි පහත විස්තර කරන ඉඩම නැවත මැනීමක් වේ.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත් සිංහල පත්තුවේ, දිවුලන්කඩවල ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්වරයා විසින් සකස් කරන ලද අංක 153 දරන කොලනි පිඹුරේ, ලොට් අංක 185 ලෙස දැක්වෙන "දිවුලන්කඩවල මූකලාන (ගොඩ)" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. පියදාස විසින් මැන සාදන ලද අංක 2006/162 හා 2006.08.19 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ සම්පූර්ණ බිම් කොටසට මායිම්, උතුරට : එෆ්. සී. පී. පො. 153 පිඹුරේ ලොට් අංක 193 ද, නැගෙනහිරට : එෆ්. සී. පී. පො. 153 පිඹුරේ ලොට් 48 ද, දකුණට : එෆ්. සී. පී. පො. 153 පිඹුරේ ලොට් 191 ද, බස්නාහිරට : එෆ්. සී. පී. පො. 153 පිඹුරේ ලොට් 47 1/2 ද යන මායිම් ඇතුළත, අක්කර දෙකකුත් රූඩ් එකකුත් පර්චස් විසි දෙකක් (අ. 2, රූ. 1, පර්. 22) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-154/6

**සෙලාන් බැංකුව පීඑල්සී මොරටුව ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0090-256725-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 ජූලි මස 18 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. සී. ලියනගේ විසින් සහතික කරන ලද 2001 මාර්තු මස 01 වැනි දිනැති අංක 27 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මොරටුව පදිංචි කෝට්ටගේ දොන් රෝහන පද්මසිරි යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හැට දෙදහස් හත්සිය දහසය (රු. 5,62,716) මුදලක්, 2005 නොවැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,62,716 මුදල ද, 2005 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 27 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ රාවතාවත්ත පිහිටි 2 වැනි පටු මග, රාවතාවත්ත වරිපනම් අංක 23 දරන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. පී. එල්. ඩී. සිල්වා විසින් සාදන ලද 2000 ජූලි මස 31 වැනි දිනැති අංක 1079 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන වඩුගේවත්ත සහ පහලවත්ත නමැති ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම් කැබලි අංක ඒ1 ලකුණු කල (බලයලත් මිනින්දෝරු එල්. ජී. එච්. ද සිල්වා විසින් සාදන ලද 1976 මාර්තු 5 දිනැති අංක 289 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඒ කැබැල්ලෙහි නැවත මැනීමක් වන අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු කේ. ආර්. පී. පෙරේරා විසින් සාදන ලද අංක 969 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 3 සහ අංක 1079 දරන සැලැස්මේ සඳහන් ඒ2 කැබැල්ල ද, නැගෙනහිරට : අංක 1079 දරන සැලැස්මේ සඳහන් ඒ2 කැබැල්ල සහ නන්දන කේ. ද සිල්වා යන අයගේ ඉඩම ද, දකුණට : නන්දන කේ. ද සිල්වා යන අයගේ ඉඩම සහ බස්නාහිරට : රාවතාවත්ත 2 වැනි පටුමග ද යන මායිම් තුළ එකී අංක 1079 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම අටයි දෙකක් (අ. 0. රූ. 0, පර්. 9.82) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2524/168 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

04-144/5

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට පොලොන්නරුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 737 හා 2007 මැයි මස 24 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "සුනිල් හෝම් බිල්ඩර්ස් ඇන්ඩ් ඩිසයිනිං ඇසෝෂියේට්ස් " යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන පොල්ගහවෙල වර්ණකුලසූරිය සුනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 737 දරන උකස් බැඳුම්කරය මත එකී වර්ණකුලසූරිය සුනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් නවලක්ෂ පනස් හත් දහස් තුන්සිය පහළොවකුත් ශත පනස් හයක (රු. 9,57,315.56) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ විසිහය දහස් අසූවක් (රු. 8,26,080) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් නවලක්ෂ පනස් හත් දහස් තුන්සිය පහළොවකුත් ශත පනස් හයක (රු. 9,57,315.56) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ විසිහය දහස් අසූවක්

(රු. 8,26,080) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 737 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 737 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්නේස්සරම් පත්තුවේ, මෙරවෙල ග්‍රාම නිලධාරි වසමේ, මෙරවෙල පිහිටි "බෲක් සයිඩ් වත්ත" නමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයා විසින් සකස් කරන ලද පී. පී. ඒ. 1704 දරන ක්ෂේත්‍ර පත්‍රයේ, ලොට් අංක 72 ලෙස ලකුණු කළ බෙදා වෙන් කල බිම් කොටසට මායිම්, උතුරට : ලොට් අංක 69 ද, නැගෙනහිරට : ලොට් අංක 71 ද, දකුණට : ලොට් අංක 93 ද, බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් හතක් (අ. 0, රූ. 1, පර්. 7) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

නැවත මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්සරම් පත්තුවේ, මෙරවල ග්‍රාමයේ පිහිටි, "බෲක් සයිඩ් වත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. ඩන්ස්ටන් පෙරේරා විසින් අලුතෙන් ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 69 සහ 70 ද, නැගෙනහිරට : ලොට් අංක 71 සහ 94 ද, දකුණට : ලොට් අංක 93 සහ පාර ද, බස්නාහිරට : පාර ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් හතක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම හලාවත ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-154/3

### ඩීඑෆ්සීසී බැංකුව

#### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 626 හා 2006 දෙසැම්බර් මස 20 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "අරුණ හොටෙල් " යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයන් ලෙස පොළොන්නරුවේ ව්‍යාපාරය කරගෙන යන (මෙහි මින් ඉදිරියට "හවුල්කරුවන් " යනුවෙන් සඳහන් කරන) රාජපක්ෂ ගමගේ අරුණ ගුණසේකර සහ විජේසුන්දර මුදියන්සේ රාළහාමිලාගේ ලලිතා ස්වර්ණා කුමාරිහාමි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 626 දරන උකස් බැඳුම්කරය මත එකී රාජපක්ෂ ගමගේ අරුණ ගුණසේකර සහ විජේසුන්දර මුදියන්සේ රාළහාමිලාගේ ලලිතා ස්වර්ණා කුමාරිහාමි යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් නවලක්ෂ තිස්හය දහස් හැත්තෑ දෙකකුත් ශත විසි දෙකක (රු. 9,36,072.22) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ හැත්තෑ පන් දහසක් (රු. 6,75,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් නවලක්ෂ තිස්හය දහස් හැත්තෑ දෙකකුත් ශත විසි දෙකක (රු. 9,36,072.22) මුදල සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ හැත්තෑ පන් දහසක් (රු. 6,57,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගනන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 626 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත

උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 626 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ/කෝරළයේ අංක 135 පුලස්තිගම ග්‍රාම නිලධාරී වසමේ, පුලස්තිගම ග්‍රාමයේ පිහිටි, රජයේ මිනින්දෝරු ටී. එච්. ඒකනායක විසින් සකස් කරන ලද අංක අ. ජා. පි. පො. 06 දරන කට්ටි කැඩීමේ පිඹුරේ, පො. 7902 අංක 17 දරන Giels Sheet පත්‍රයේ අංක 15 පරිපූරකයේ ලොට් අංක 563 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : 486A ඉඩමේ කොටසක්, බු. පි. 11 සහ 1341 කොටසක් හා 489 කොටසක් ද, නැගෙනහිරට : 489 ඉඩමේ කොටසක් ද, දකුණට : 488 ඉඩමේ කොටසක් ද, බස්නාහිරට : 488 ඉඩමේ කොටසක්. 485, 562 සහ 486 ඉඩම් ද යන මායිම් ඇතුළත හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි හතයි හතයි හයක (හෙ. 0.0776) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-154/2

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එස්. පනාමල්දෙණිය විසින් ලියා සහතික කරන ලද අංක 3051 හා 2004 ජනවාරි මස 02 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම නුවරඑළියේ, ගරුමුන්න ආරච්චිලාගේ ජනක නිශාන්ත යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට ඉහත කී අංක 3051 දරන උකස් බැඳුම්කරය මත එකී ගරුමුන්න ආරච්චිලාගේ ජනක නිශාන්ත යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් අටලක්ෂ අනූ දහස් එකසිය දොළහකුත් ශත හැත්තෑ දෙකක (රු. 8,90,112.72) මුදලක් සහ 2009 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ අනූහය දහස් පන්සිය නවයකුත් ශත තුනක් (රු. 5,96,509.03) සඳහා වර්ෂයකට සියයට දහහතරකුත් දශම පහ (14.5%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අටලක්ෂ අනූ දහස් එකසිය දොළහකුත් ශත හැත්තෑ දෙකක (රු. 8,90,112.72) මුදල සහ 2009 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ අනූ හය දහස් පන්සිය නවයකුත් ශත තුනක් (රු. 5,96,509.03) සඳහා වර්ෂයකට සියයට දහහතරකුත් දශම පහ (14.50%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3051 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 3051 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය මහ නගර සභා බල ප්‍රදේශය සහ නුවරඑළිය නගරය ඇතුළත, බොරලන්දේ පිහිටි බරලන්ද නොහොත් "සමරවික්‍රම ලෑන්ඩ්" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් මැන සාදන ලද අංක 1392 සහ 1998 මාර්තු මස 02 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලෙස ලකුණු කළ, පර්චස් හයකුත් දශම බිංදුවයි පහක (අ. 0, රූ. 0, පර්. 6.05) බිම් ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කළ ඉඩමට එකී පිඹුරට ප්‍රකාර මායිම්, උතුරට : පේදුරු ෆැක්ටරියට යන පාර ද, නැගෙනහිරට : "පේදුරු එස්ටේට්" වත්ත හිමිකම් කියන ඉඩම ද, දකුණට : අංක 1392 පිඹුරේ ලොට් අංක 3 ද, බස්නාහිරට : එකී පිඹුරේ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත පිහිටි ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 4 දරන ගොඩනැගිල්ල සහිත ඉඩම සහ එහි පිහිටි වෙනත් සියලු දේ. මෙම ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-154/1

## සීමාසහිත සෙලාන් බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2000 සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. එමානුවල් පින්තු විසින් සහතික කරන ලද 1998 අප්‍රේල් මස 07 වැනි දිනැති අංක 3408 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ආඬිගම, ගල්කුලම පදිංචිකරුවන් දෙදෙනා වන සේනානායක මුදියන්සේලාගේ සිරිපාල, "බන්ධනදායී " වශයෙන් සහ මණ්ඩල වල්ලි ආචාරිගේ විනිfප්‍රීඩා, "බන්ධනදායී/උකස්කරු" වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 1999.07.31 වැනි දින වන විට එක්ලක්ෂ අනූහය දහස් අටසිය දාහතරයි ශත දහසයක (රු. 1,96,814.16) මුදලක් සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,96,814.16 මුදල ද, 1999.08.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිහ (30%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3408 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ, කුමාර වන්නි පළාතේ, කුමාර පල්ලම් පත්තුවේ, පල්ලම ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර් කොට්ඨාශයේ, ගල්කුලම පිහිටි, 1996.02.26 දින දරන දීමනා (Gran) අංක පුත්/ලේ/ප්‍ර/28967හි විස්තර කර ඇති, බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් සාදන ලද 1997.11.30 වැනි දින අංක 2349 දරන සැලැස්මේ දැන් අංක 1 දරන බිම් කැබැල්ල ලෙස පෙන්වා ඇත්තාවූ ද, උතුරට : එල්. ජී. පියසේනට අයත් ඉඩම ද, නැගෙනහිරට : අක්කර අට මැද පාර ද, දකුණට : හජ්ජියාර්ට අයත් ඉඩම ද, බස්නාහිරට : එච්. එම්. රන්හාමිට අයත් ඉඩම ද, යන මායිම් තුළ අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල වූ ද, එල් ඩී ඕ 64/249හි ලියාපදිංචි කර ඇත්තා වූ ද, දැන් "සෙන්ට් ඇන්තනි වත්ත" නමැති ඉඩම් කොටස, එහි ඇති සියලු දේද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති.

04-144/2

## සීමාසහිත සෙලාන් බැංකුව - හලාවත ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0150-00003040-001.

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 නොවැම්බර් මස 24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස් එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2004 ඔක්තෝබර් මස 11 දිනැති අංක 291 සහ 2005 නොවැම්බර් මස 23 වැනි දිනැති අංක 484 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, වැල්ලරාව ජීවන්ත කැලුම් ෆයිබර් මිල් හි කළුආරච්චිගේ ජයරත්න සහ කළුආරච්චිගේ ජීවන්ත කැලුම් ජයරත්න යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් අටලක්ෂ දොළොස් දහස් පන්සිය නවයයි ශත අසූනවයක් (රු. 8,12,509.89) මුදලක්, 2006 මැයි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 8,12,509.89 මුදල ද, 2006 ජූනි මස 01 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 291 සහ 484 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ යාගම් පත්තු කෝරළේ, කටුගම්පල හත්පත්තුවේ, පහල කලුගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ජී. එස්. බී. පරාක්‍රම විසින් සාදන ලද 1983.04.04 දිනැති අංක 606 දරන සැලැස්මේ සඳහන් තලගහවත්ත, කැටකැලගහවත්ත, කොහොඹගහවත්ත, කැටකැලගහවත්ත සහ තලගහවත්ත නමැති ඉඩමේ (බලයලත් මිනින්දෝරු එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් 2004.09.03 වැනි දින මායිම් නැවත පරීක්ෂා කර සහතික කරන ලදී) කැබලි අංක 01 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඒ. පී. සුගතදාසට අයිති ඉඩම සහ වී. තිලකරත්නට අයිති ඉඩම සහ එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 2 ද, නැගෙනහිරට : තලගහපිටිය සිට පතනට යන ගම්සභා පාර ද, දකුණට : එච්. පී. විජේරත්නට සහ තවත් අයට අයිති ඉඩම සහ කලුගම පන්සලට අයිති ඉඩම සහ බස්නාහිරට : සිරියාවතීට අයිති ඉඩම යන මායිම් තුළ අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිස් හතරක් (අ. 1, රූ. 3, පර්. 34) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි

කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත් ඉරුව ආර් 82/259හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති).

04-144/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - කළුතර ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009 ජනවාරි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2003.06.26 දින සහ අංක 457 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පූනම් ක්‍රිස්තෝම්බුගේ සුජිත් තුෂාර ද සිල්වා සහ අත්ඩවත්ත කංකානම්ලාගේ ප්‍රියංතිකා නිල්මිණි යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ දෙදහස් හාරසිය හැත්තෑහතරයි ශත අසූතුන (රු. 5,02,474.83) ක මුදලක් 2008.05.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,02,474.83ක මුදලට 2008.05.31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 457 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුල්ල උතුර කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ නාගොඩ උපකාර්යාල සීමාව තුළ, උග්ගල්බොඩ, එදිරිකැලේ වත්ත නමැති ඉඩමට බලයලත් මානක එල්. ඩබ්. කේ. පෙරේරා විසින් මැන සාදන ලද 1998.03.21 වැනි දින පිඹුරු අංක 140හි ලොට් අංක 1 දරන කොටසට මායිම්, උතුරට : බලයලත් මානක යූ. එම්. ද සිල්වා විසින් 1974.06.13 සහ ජුලි 06 සහ 08 දිනයන්හි මැන සාදන ලද පිඹුරු අංක 1854හි ලොට් අංක 13න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 1854හි ලොට් 3න් ද, දකුණට : පිඹුරු අංක 140හි ලොට් අංක 2න් ද, සහ බටහිරට : පිඹුරු අංක 140හි ලොට් අංක 8න් ද මායිම් වූ පර්චස් පහලොව (අ. 0, රූ. 0, පර්. 15)ක් විශාල ඉඩම වේ. මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 197/232 පත්ඉරුව යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

04-147/4

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නුවරඑළිය ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009 ජනවාරි මස 22 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2005.07.08 දින සහ අංක 693 සහ 2008.03.18 දින සහ අංක 1420 සහ 2008.09.23 දින අංක 1575 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වීරසේකර මුදියන්සේලාගේ ඉන්දික තුෂාර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පහලොස් මිලියන තිස්දහස් හයසිය දාසයයි ශත අනූව (රු. 1,50,30,616.90) ක මුදලක් 2008.10.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,50,30,616.90 ක මුදලට 2008.11.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 693, 1420 සහ 1575 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ ලේඋල-දොඩන්වෙල හි පිහිටි වරිපනම් අංක 330 දරන මහකහටගහමුලවත්ත හෙවත් නාගහතැන්නවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජී. ආර්. ඩබ්. එම්. විරකෝන් විසින් මැන සාදන ලද අංක 4036 සහ 1987 සැප්තැම්බර් මස 12 වැනි දින දරන පිඹුරු ප්‍රකාර බෙදා වෙන්

කරන ලද ලොට් 03 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ගමහගේ ඉඩමට අයත් වැටෙන් ද, නැගෙනහිරට : ලොට් 4න් ද, දකුණට : ලොට් 2න් ද සහ බස්නාහිරට : දොඩන්වෙල-මහනුවර පාරෙන් ද මායිම් වූ පර්චස් දොළහයි දශම එක (අ. 0, රූ. 0, පර්. 12.1) ක් විශාල ඉඩමට අයත් සියලුම දේත් සමග මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු ඒ 409/53 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම නැවත මැනීමකින් පසුව මෙසේ විස්තර වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ ලේඋල-දොඩන්වෙල හි පිහිටි වරිපනම් අංක 330 දරන "මහකහටගහමුලවත්ත හෙවත් නාගහතැන්නවත්ත" නමැති ඉඩමට බලයලත් මානක සී. පාලමකුඹුර විසින් මැන සාදන ලද අංක 3496 සහ 1997 මැයි මස 23 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වන උතුරට : ගොම්මනේ හේන වත්තට අයත් වැටෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 4036 දැන් අංක 320 දරන පරිශ්‍රයට අයත් ලොට් 4න් ද, දකුණට : පිඹුරු අංක 4036 දැන් අංක 328 දරන පරිශ්‍රයට අයත් ලොට් 2න් ද සහ පිඹුරු අංක 4036ට අයත් ලොට් 7න් ද සහ බස්නාහිරට : ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවතෙන් ද මායිම් වූ පර්චස් දොළහයි දශම නමයයි හතර (අ. 0. රූ. 0, පර්. 12.94) ක් විශාල ඉඩමට අයත් සියලුම දේත් සමග වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු ඒ 313/287 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 693, 1420 සහ 1575 දරන බැඳුම්කරයන්හි දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

04-147/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - හල්ස්ඩ්‍රොප් ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008 නොවැම්බර් මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2007.01.24 දින සහ අංක 2802 සහ 2007.06.11 දින සහ අංක 3231 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙදදේවගේ ජගත් රුවන් කුමාර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්නවලක්ෂ අසූදහස් දෙසීය හතලිස්දෙකයි ශත හතලිස්එක (රු. 39,80,242.41) ක මුදලක් 2008.08.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 39,80,242.41 ක මුදලට 2008.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2802 සහ 3231 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ නවගමුව ගමෙහි පිහිටි "චන්ද්‍රගරවත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් මැන සාදන ලද 2003.11.19 දිනැති අංක 189/2003 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද "ලොට් 24" (මෙය බලයලත් මානක කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් මැන සාදන ලද 2003.11.16 දිනැති අංක 188/2003 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1හි නැවත මැනීමක් සහ උප බෙදුමක් වේ) ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් ආර් 6 (මීටර් 4.5ක පළල පාර) න් ද, නැගෙනහිරට : ලොට් ආර් 6 (මීටර් 4.5ක පළල පාර) න් සහ ලොට් 25න් ද, දකුණට : පාරෙන් ද, සහ බස්නාහිරට : ලොට් අංක 22 සහ 23න් ද මායිම් වූ එකී අංක 189/2003 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම අටයි පහ (අ. 0, රූ. 0. පර්. 12.85) ක විශාල ඉඩම වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1698/187හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

04-147/2

---

## සෙලාන් බැංකුව පී.එල්.සී - ගම්පහ ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0110-පී 61803-001.

සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 නොවැම්බර් මස 06 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජයවික්‍රම විසින් සහතික කරන ලද 2006 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 3000 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ගම්පහ පදිංචි හේමක කෙවින්ද සතරසිංහ සහ විතාන කුරුප්පු ආරච්චිගේ අසෝකා මාලනී යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහතුන්ලක්ෂ පනස්හයදහස් අටසිය තිස්එකයි ශත තිස්තුනක (රු. 13,56,831.33) මුදලක්, 2008 මාර්තු මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 13,56,831.33 මුදල ද, 2008 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3000 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ කිරිකිත්ත ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද 1995.10.22 දිනැති අංක 7088 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන හල්ලතේලන්ද නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : ජේම්ස් අප්පුහාමිගේ ඉඩම (මෙම ඉඩමේ කොටස) ද, දකුණට : ඇල සහ බස්නාහිට : එච්. ඒ. සිරිපාලගේ ඉඩම යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් දහහතක් (අ. 0, රූ. 1, පර්. 17) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

04-145/2

---

## සෙලාන් බැංකුව පී.එල්.සී - පිටකොටුව ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0640-068576-001.

සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රාගි සිවදාසන් විසින් සහතික කරන ලද 2005 ජූලි මස 25 වැනි දිනැති අංක 284 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 15, ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 38431 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන වේස් කොලැබ් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කොළඹ 15 පදිංචි මෝහන කන්දකුමාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් අටලක්ෂ අසූදෙදහස් හයසිය හැටහතරයි ශත විසිතුනක (රු. 48,82,664.23) මුදලක්, 2008 ජනවාරි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 48,82,664.23 මුදල ද, 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 284 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභාවේ පරිපාලන සීමාව තුළ වෝඩ් අංක 5 ලුණුපොකුණ මෝදර මෝබ්‍රේ ලේන් හි පිහිටි බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1989.11.29 දිනැති අංක 2579 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ග්‍රොටෝ නමැති ඉඩමේ එළි හවුස් පාර වරිපනම් අංක 34/1බී දරන ලොට් 3බී ලකුණු කළ (බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් සාදන ලද 1957.07.20 වැනි දිනැති අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3 ලෙස නිරූපනය වන ඉඩමේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පෙර කී අංක 2579 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3සී (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ පෙර කී අංක 2579 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3ඒ ද, නැගෙනහිරට : අළුත් මාවත පාර වරිපනම් අංක පී 323 දරන පරිශ්‍රය ද, දකුණට : ඇල සහ වෙන් කිරීම සහ බස්නාහිරට : එළිහවුස් පාර වරිපනම් අංක 34/1ඒ දරන පෙර කී අංක 78 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද යන මායිම් තුළ පෙර කී අංක 2579 දරන සැලැස්ම අනුව පර්චස් දොළහයි දශම අටයි නවයක් (අ. 0, රූ. 0, පර්. 12.89) විශාල, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 1049/204 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී වෝඩ් අංක 5 ලුණුපොකුණ මෝදර මෝබ්‍රේ ලේන් හි පිහිටි එකී අංක 2579 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ග්‍රොටෝ නමැති ඉඩමේ ලොට් 3සී ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) (එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3 ලෙස නිරූපනය වන ඉඩමේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පෙර කී අංක 78 (පාර) දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් මෝබ්‍රේ ලේන් නමැති ලොට් 5, නැගෙනහිරට : පෙර කී අංක 2579 දරන සැලැස්මේ පෙන්නුම්

කරනු ලබන ලොට් 3ඒ ද, දකුණට : පෙර කී අංක 2579 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 3බී ද, සහ බස්නාහිරට : එළිහවුස් පාර වරිපනම් අංක 34/1ඒ දරන පෙර කී අංක 78 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද යන මායිම් තුළ එකී අංක 2579 දරන සැලැස්ම අනුව පර්චස් එකයි දශම හතයි තුනක් (අ. 0, රූ. 0, පර්. 1.73) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 1050/09 යටතේ ලියාපදිංචි කර ඇත.

3. පහත සඳහන් ඉඩම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ විදුලිය සහ දුරකථය කේබල් ඇදීමේ සහ රෑහැන් ඇදීමේ ජලපවාහන නල සහ ප්‍රධාන ජලනල සහ සම්බන්ධතා සහ වෙනත් උපක්‍රම සහ පහසුකම් යෙදීමේ අයිතිය සමග

ඒ. පෙර කී වෝඩ් අංක 5 ලුණුපොකුණ මෝදර එළිහවුස් පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් සාදන ලද 1957.07.20 දිනැති අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 5 ලකුණු කල (පාර සඳහා වෙන් කිරීම) (ග්‍රොටෝ නමැති ඉඩම සහ පරිශ්‍රයේ බෙදා වෙන් කරන ලද කොටසක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1ඒ ද, නැගෙනහිරට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1බී ද, දකුණට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 2 සහ 3 එළිහවුස් පාර වරිපනම් අංක 34/2 සහ බස්නාහිරට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 6 සහ 5ඒ සහ එළිහවුස් පාර වරිපනම් අංක 34/2 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ එකී අංක 78 දරන සැලැස්ම අනුව බලයලත් මිනින්දෝරු කේ. ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් 1957.10.07 දිනය යටතේ සංශෝධනය කිරීම අනුව පර්චස් හතයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 7.50) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 1050/10 යටතේ ලියාපදිංචි කර ඇත.

බී. පෙර කී වෝඩ් අංක 5 ලුණුපොකුණ මෝදර එළිහවුස් පාර දිගේ පිහිටි එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 6 ලකුණු කළ (ග්‍රොටෝ නමැති ඉඩම සහ පරිශ්‍රයේ බෙදා වෙන් කරන ලද කොටසක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එළිහවුස් පාර වරිපනම් අංක 44 දරන පල්ලි පරිශ්‍රය ද, නැගෙනහිරට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 5 ද, දකුණට : එළිහවුස් පාර වරිපනම් අංක 34/2 දරන පරිශ්‍රය සහ එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 6ඒ සහ බස්නාහිරට : මෝබ්‍රේ ලේන් ද යන මායිම් තුළ එකී අංක 78 දරන සැලැස්ම අනුව එකී බලයලත් මිනින්දෝරු කේ. ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් 1957.10.07 දිනය යටතේ සංශෝධනය කිරීම අනුව පර්චස් හයයි දශම පහයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 6.52) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 890/268 යටතේ ලියාපදිංචි කර ඇත.

සී. පෙර කී වෝට් අංක 5 ලුණුපොකුණ මෝදර එළිහවුස් පාර දිගේ පිහිටි එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1ඒ ලකුණු කළ (පාරක් සඳහා අතිරේක වෙන් කිරීමක් වන) (ග්‍රොටෝ නමැති ඉඩම සහ පරිශ්‍රයේ බෙදා වෙන් කරන ලද කොටසක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට සහ ඊසානට සහ නැගෙනහිරට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1බී (කලින් ලොට් 1) ද, දකුණට සහ නිරිතට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 5 (පාර සඳහා වෙන් කිරීම) යන මායිම් තුළ එකී අංක 78 දරන සැලැස්ම අනුව එකී බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් 1957.10.07 දිනය යටතේ සංශෝධනය කිරීම අනුව පර්චස් හතරයි දශම අටයි එකක් (අ. 0, රූ. 0, පර්. 4.18) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 890/269 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩී. පෙර කී වෝඩ් අංක 5 ලුණුපොකුණ මෝදර එළිහවුස් පාර දිගේ පිහිටි එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 6ඒ ලකුණු කළ (පාරක් සඳහා අතිරේක වෙන් කිරීමක් වන) (ග්‍රොටෝ නමැති ඉඩම සහ පරිශ්‍රයේ බෙදා වෙන් කරන ලද කොටසක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම්, උතුරට සහ ඊසානට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 6 (පාර) ද, නැගෙනහිරට : එකී අංක 78 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 5 (පාර සඳහා වෙන් කිරීම), දකුණට සහ නිරිතට : එළිහවුස් පාර වරිපනම් අංක 34/2 දරන පරිශ්‍රය යන මායිම් තුළ එකී අංක 78 දරන සැලැස්ම අනුව එකී බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන විසින් 1957.10.07 දිනය යටතේ සංශෝධනය කිරීම අනුව පර්චස් එකක් (අ. 0, රූ. 0, පර්. 1) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 890/270 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

04-145/1

---

## සෙලාන් බැංකුව පී.එල්.සී - ඩෙවලප්මන්ට් බැන්කිං ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0180-01413863-001.

සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 දෙසැම්බර් මස 17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රියන්ති ද සේරම විසින් සහතික කරන ලද 2004 ජූලි මස 28 වැනි දිනැති අංක 959 සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. කේ. මාම්පිටිය විසින් සහතික කරන ලද 2005 අප්‍රේල් 1 දිනැති අංක 1399 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කුරුණෑගල පදිංචි මාකේවිටගේ මහින්ද පෙරේරා සහ වික්‍රමසිංහ ආරච්චිගේ විමලසේන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හයලක්ෂ විසිඑක්දහස් තුන්සිය දහහතරයි ශත හැත්තෑ දෙකක (රු. 6,21,314.72) මුදලක්, 2008 මැයි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය

යුතුව ඇති හෙයින් ද එකී රු. 6,21,314.72 මුදල ද, 2008 ජුනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 959 සහ 1399 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුකහ කෝරළේ, දේවමැදිහත්පත්තුවේ, ගෝනව පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 1997.09.21 වැනි දිනැති අංක 132 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දන්ගස්පිටියේහේන නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ජේ. එම්. ඇල්පී සිංඤෝගේ වත්ත ද, නැගෙනහිරට : ජේ. එම්. ප්‍රේමසිරි ජයසිංහගේ වත්ත ද, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : වාරියපොල සිට කලුගමුවට යන ප්‍රධාන පාර යන මායිම් තුළ එකී අංක 132 දරන සැලැස්ම අනුව පර්චස් දහඅටයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 18.9) විශාල ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව ඩී1022/255හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 1 පහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

පෙර කී ගෝනව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1983.11.27 දිනැති අංක 191/93 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දන්ගස්පිටියේහේන නමැති ඉඩමේ ලොට් 1බී ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ජේ. එම්. අප්පු සිංඤෝගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් 1ඒ ද, දකුණට : තෙලේනිස් අප්පුහාමිගේ ඉඩම සහ බස්නාහිරට : වාරියපොල සිට කලුගමුව දක්වා පාර යන මායිම් තුළ එකී අංක 191/83 දරන සැලැස්ම අනුව පර්චස් විසිහතරක් (අ. 0, රූ. 0, පර්. 24) විශාල, ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

04-144/6

---

### සෙලාන් බැංකුව පී.එල්.සී - මොරටුව ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0090-157093-001.

සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් සහතික කරන ලද 1998 පෙබරවාරි මස 26 වැනි දිනැති අංක 856 සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1999 දෙසැම්බර් මස 09 වැනි දිනැති අංක 2298 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම මොරටුව පදිංචි ගාර්දියවසම් ලිඳමුලගේ හඩ්සන් ද සිල්වා සහ වන්නකුවත්ත වඩුගේ චාලට් ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හාරලක්ෂ විසිඅටදහස් හත්සිය අසූඑකයි ශත දොළහක (රු. 4,28,781.12) මුදලක්, 2007 ජූලි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 4,28,781.12 මුදල ද, 2007 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 856 සහ 2298 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ ඉඳිබැද්ද පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ඒ. පී. මැන්දිස් විසින් සාදන ලද 1985 සැප්තැම්බර් මස 9 සහ 18 වැනි දිනැති අංක 402 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කහටගහවත්ත, මුංහේන්තුඩුවේවත්ත සහ මුංහේන්තුඩුවේ ගොඩපොරගහවත්ත නමැති ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කල සුදර්මරත්නාරාම පටුමග වරිපනම් අංක 7/2ඒ දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම්, උතුරට : කේ. එස්. ප්‍රනාන්දුගේ සහ ගොඩ්සන් ද සිල්වාගේ ඉඩම් ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 7 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ එල්. ජේ. ද සිල්වාට අයිති මෙම ඉඩමේ කොටස සහ බස්නාහිරට : තිලක් ප්‍රනාන්දුගේ මෙම ඉඩමේ කොටස යන මායිම් තුළ එකී අංක 402 දරන සැලැස්ම අනුව පර්චස් විසිහතයි දශම තුනයි අටක් (අ. 0, රූ. 0, පර්. 27.38) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ (දැන් ගල්කිස්ස) හිමිකම් එම් 1175/265 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් විස්තර කරනු ලබන මාර්ගය සඳහා වෙන් කිරීම් තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග

පෙර කී ඉඳිබැද්ද පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩබ්ලිව්. ඒ. පී. මැන්දිස් විසින් සාදන ලද 1985 සැප්තැම්බර් මස 09 සහ 18 දිනැති අංක 402 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කහටගහවත්ත, මුංහේන්තුඩුවේවත්ත සහ මුංහේන්තුඩුවේ ගොඩපොරගහවත්ත නමැති ඉඩමේ ලොට් 7 (අඩි 20ක් පළල) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් 1, 2, 3, 4, 5 සහ 6 ද, නැගෙනහිරට : පානදුර ගඟ සහ ලොට් 12 ද, දකුණට : ලොට් 8, 10, 11 සහ 12 සහ අඩි

20ක් පළල පාර සහ බස්නාහිරට : එල්. ජේ. ජී. ද සිල්වා ට අයිති මෙම ඉඩමේ කොටස ද යන මායිම් තුළ එකී අංක 402 දරන සැලැස්ම අනුව පර්චස් විසිඅටයි දශම හතයි හතක් (අ. 0, රූ. 0, පර්. 28.77) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ (දැන් ගල්කිස්ස) හිමිකම් එම් 2028/268 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

04-144/4

---

## සෙලාන් බැංකුව පී.එල්.සී. - හලාවත ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ සම්මුතිය

ගිණුම් අංකය : 0150-00051611-001.

සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. ද ලිවේරා විසින් දෙකම සහතික කරන ලද 1993.08.26 දිනැති අංක 1316, 1994.09.05 දිනැති අංක 2398 සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්තු විසින් සහතික කරන ලද 1995.07.13 වැනි දිනැති අංක 2690 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම මාදම්පේ පදිංචි මැල්ලව තන්ත්‍රිගේ අජිත් පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හැටදෙලක්ෂ තුන්දහස් අටසිය විසිඅටයි ශත තිස් හයක (රු. 62,03,828.36) මුදලක්, 2008 ජනවාරි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 62,03,828.36 මුදල ද, 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1316, 2398 සහ 2690 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් කඩවත් හි සහ පුත්තලම් පත්තු උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරීගේ කොට්ඨාසයේ අට්ටිවිල්ලු පිහිටි මිනුම්පති විසින් සාදන ලද එෆ් පිඹුරු අංක 1හි ක්ෂේත්‍ර සටහන් පත්‍ර අංක 4හි අංක 4 දරන සිතුවමෙහි ලොට් 163 ලකුණු කළ අට්ටවිල්ලු නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 164 ද, නැගෙනහිරට : සහ දකුණට : පාර සහ බස්නාහිරට : ලොට් 165 යන මායිම් තුළ අක්කර නවයයි රූඩ් දෙකයි පර්චස් තිස් හතක් (අ. 9. රූ. 2, පර්. 37) විශාල ඉඩම. මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම්/ කාණ්ඩය/පත්‍රිරුව එල්ඩීඕ 31/271 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ පිටිගල් කෝරළේ, උතුර යාගම්පත්තුවේ උරලියගාර පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විමලසේන විසින් සාදන ලද 1991.10.28 දිනැති අංක 101 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොහොඹගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදූ ඉඩම් කොටසට, මායිම් උතුරට : එම්. ටී. පෙරේරාගේ ඉඩම ද, නැගෙනහිරට : මීගමුව සිට හලාවත දක්වා මහා මාර්ගය දිගේ වෙන් කළ ඉඩම ද, දකුණට : කේ විමලදාසගේ ඉඩම සහ බස්නාහිරට : අඩි 10ක් පළල පාර යන මායිම් තුළ පර්චස් නවයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 9.5) විශාල ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය ආර් 17/60හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

04-144/1

---

## රුහුණ සංවර්ධන බැංකුව - තල්ගස්වල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 වැනි දින දරන අති විශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2008.08.28 වැනි දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජේ. ටී. එල්. නන්දන මහතා විසින් සහතික කරන ලද 2002.08.23 දිනැති අංක 2238 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, තල්ගස්වල, මානම්පිට, "ගයානි" ලිපිනයේ පදිංචි රණවීර ආරච්චිගේ ගුණදාස ඩයස් සහ රණවීර ආරච්චිගේ ධම්මික ඩයස් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂ පනස් අටදහසක් (රු. 4,58,000) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008.03.11 වැනි දින සිට වර්ෂයකට 25.5%

බැගින් රුපියල් හාරලක්ෂ පනස් අටදහසක (රු. 4,58,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2238 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර වලල්ලාවිටි කෝරලයේ (නැගෙනහිර) නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පෝද්දිවල, මත්තක පිහිටි මාරක්ගොඩවත්ත නමැති රජයේ ඉඩමේ අංක 580 දරන කැබැල්ල නම් වූ උතුරට : කැබලි අංක 571 සහ 575 ද, නැගෙනහිරට : කැබලි අංක 365 සහ 575 ද, දකුණට : කැබලි අංක 365 සහ 602 ද සහ බස්නාහිරට : කැබලි අංක 571 සහ 602 ද මායිම් වූ රූඩ් එකයි, පර්චස් තිස් අටක් (අ. 0, රූ. 01, පර්. 38)ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේ ද වේ.

මෙම දේපල LDOP/15/85 වං 08/187 යටතේ 2002.08.26 දින ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අමරසේන ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක.

2008 අගෝස්තු මස 28 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරණ, මාතර.

04-07

---

## මහජන බැංකුව - මිද්දෙණිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.11.23 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මහත්මිය විසින් සහතික කරන ලද 2007.03.22 දිනැති අංක 2298 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වීරක්කොඩි ආරච්චිගේ සුගතදාස සහ වීරක්කොඩි ආරච්චිගේ නිරූපමා නිරෝෂණී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ අනූහය දහස් පන්සිය හැටහයයි ශත පනස් දෙකක (රු. 2,96,566.52) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.05.23 දින සිට වර්ෂයකට 18.5% බැගින් රුපියල් දෙලක්ෂ අනූහය දහස් පන්සිය හැට හයයි ශත පනස් දෙකක (රු. 2,96,566.52) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ අනූහය දහස් පන්සිය හැට හයයි ශත පනස් දෙකක (රු. 2,96,566.52) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ඉහත කී අංක 2298 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, කටුවන ප්‍රාදේශීය ආදායම් කොට්ඨාසයේ, උලහිටියාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොහොඹකඩේ නමැති ඉඩමට සකස් කරන ලද සර්වේ ජනරාල්වරයාගේ 1986.09.10 දිනැති අවසාන ගම් පිඹුරු අංක 390හි අංක 482 දරන ඉඩම් කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට එම පිඹුරේම අංක 480 සහ අංක 481 දරන කැබැලි ද, නැගෙනහිරට : එම පිඹුරේම අංක 545 දරන කැබැල්ල ද, දකුණට : එම පිඹුරේම අංක 499 දරන කැබැල්ල ද, බටහිරට : එම පිඹුරේම අංක 483 සහ අංක 484 දරන කැබැලි ද යන සතර මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම හතරක් (හෙක්. 0.400) විශාල ඉඩම් සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සෑම සියළු දෙයද වේ.

මෙය තංගල්ල දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ හම්/ප්‍ර/13045 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
හම්බන්තොට.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 7ඒ, ටවර්හිල් මාවත,
හම්බන්තොට.

04-96

---

## මහජන බැංකුව - හික්කඩුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඞී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.19 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2007.05.24 දින ලියා සහතික කරන ලද අංක 1440 දරන උකස්කරය සහ 2005.09.26 දින ලියා සහතික කරන ලද අංක 105 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, විතානආරච්චිගේ චන්දන, අනුෂ්කා සෙනෙවිරත්න යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර යටතේ දැනට රුපියල් එකොලොස් ලක්ෂ දාහතරදහස් පන්සිය අසූදෙකයි ශත හැත්තෑදෙකක (රු. 11,14,582.72)ක මුදලක් සහ රුපියල් හාරලක්ෂ අසූහත්දහස් පන්සියයක (රු. 4,87,500) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.07.29 දින සිට වර්ෂයකට 21% බැගින් රුපියල් එකොලොස්ලක්ෂ

දාහතරදහස් පන්සිය අසූදෙකයි ශත හැත්තෑදෙකක් (රු. 11,14,582.72) මුදලක් සහ 2008.07.29 වැනි දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් හාරලක්ෂ අසූහත්දහස් පන්සියයක (රු. 4,87,500) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එකොලොස්ලක්ෂ දාහතරදහස් පන්සිය අසූදෙකයි ශත හැත්තෑ දෙකක (රු. 11,14,582.72) මුදල සහ රුපියල් හාරලක්ෂ අසූ හත්දහස් පන්සියයක (රු. 4,87,500) මුදලක් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 1440 සහ 105 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුව වැවල පිහිටි වැලිලියද්ද නමැති ඉඩමට බලයලත් මිනින්නදෝරු ආර්. එස්. වීරසේකර විසින් 2005.05.20 වැනි දින මැන සම්පාදිත පිඹුරු අංක 1479 ප්‍රකාර කැබලි අංක බී දරන කැබැල්ල නැවත බෙදා වෙන්කළ කැබලි අංක බී04 නමැති ඉඩමට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : පොද්දුවගේ වෙල සහ මෙම ඉඩමේ කැබලි අංක බී 05 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක බී 05 සහ වැවලගොඩ පාර ද, දකුණට : වැවලගොඩ පාර සහ මෙම ඉඩමේ කැබලි අංක බී03 ද, බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක බී03 සහ පොද්දුවගේ වෙල ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දාහතරක් (අ. 0. රූ. 0, පර්. 14) විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ඇතුළු සියලු දේද වේ. මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 835/64 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

04-95

---

## මහජන බැංකුව - හික්කඩුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. ආරෝෂනී විසින් 2005.05.26 දින ලියා සහතික කරන ලද අංක 308 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සම්මු ජයනේරිස් මහතා/ සම්මු ඉන්ද්‍රානි රේණුකා මහත්මිය යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස් දෙකයි ශත විසිහතර (රු. 2,83,332.24)ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.08.01 දින සිට වර්ෂයකට සියයට දාහතයි දශම දෙකයි පහ (17.25%) බැගින් රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස් දෙකයි ශත විසිහතරක (රු. 2,83,332.24) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් තුන්සිය තිස් දෙකයි ශත විසිහතරක (රු. 2,83,332.24) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 308 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, හික්කඩුව ප්‍රාදේශීය සභා සීමාව තුළ රත්ගම ගම්මැද්දේගොඩ පිහිටි දෙහිගහවත්ත නමැති ඉඩමේ අංක 01 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1985.06.30 වැනි දින මැන සම්පාදිත අංක 255 පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ගාලු දිසා අධිකරණයේ සී ආර් නඩු අංක 22909 හි ගොනුකර ඇති බලයලත් මිනින්දෝරු එස්. ඒ. බීබී විසින් මැන සම්පාදිත අංක 277 දරන පිඹුරෙහි සඳහන් සියඹලාගහවත්තෙහි කැබලි අංක 06 සහ 07 ද, නැගෙනහිරට : දෙහිගහවත්ත ඉඩමෙහි ඉතිරි කොටස ද, දකුණට : දෙහිගහවත්ත ඉඩමෙහි කොටසක් ද සහ බස්නාහිරට : දූම්රිය පාර සහ පාරට අත්හරින ලද කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් පහලොවයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 15.25) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේ ද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 736/95 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

04-93

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ

118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 පෙබරවාරි මස 24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ෂලි කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 915 සහ 2008 මාර්තු මස 18 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු "උකස්කරු" වශයෙන් හඳුන්වනු ලබන) කොලොන්නාව කැප්පෙටිපොළ ගාර්ඩින් හි අංක 123/8/2 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් ඉෆ්තිකාර් නිසාර් යන අය විසින් ලබාගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම් සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කර මත 2008.12.26 වැනි දිනට රුපියල් දහඅටලක්ෂ තුන්දහස් හයසිය හතලිස් තුනකුත් ශත හතලිස්හයක මුදලක් (රුපියල් 18,03,643.46) වර්තමානයේදී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින් බැවින් ද,

ඉහත කී රුපියල් දහඅටලක්ෂ තුන්දහස් හයසිය හතලිස්තුනකුත් ශත හතලිස්හයක මුදල (රු. 18,03,643.46) සහ 2008.12.26 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වශයෙන් රුපියල් දහසයලක්ෂ හැත්තෑඑක්දහස් දෙසීය අසූපහකුත් ශත හතලිස් එකක මුදල (රු. 16,71,285.41) මත 2008.12.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 30% බැගින් තවදුරටත් පොලිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම් ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත මාලිගාවත්ත කොට්ඨාස අංක 15 බටහිර මාලිගාවත්තේ පිහිටි මාලිගාවත්ත යෝජනා ක්‍රමයට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ආර්. ෆීලික්ස් පෙරේරා විසින් මැන සාදන ලද අංක Con/NA/104A/Lot 11 සහ 1984 දෙසැම්බර් මස 27 වැනි දින දරන සහාධිපත්‍ය පිඹුරේ 03 වැනි පිටුවේ නිරූපිත ලොට් 11 දරන බිම් කොටසේ පිහිටි මාලිගාවත්ත ජාතික නිවාස යෝජනා ක්‍රමයේ C කොටස ලෙස ලකුණු කරන ලද මහල් පහක් (05) සහිත ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටි C/G/10 වශයෙන් ලකුණු කළ, පොදු පහසුකම් වලින් 0.88% සහ ඉහත කී සහාධිපත්‍ය පිඹුරේ 03 වැනි පිටුවේ නිරූපිත CE1 සිට CE5 දක්වා ලකුණු කළ පොදු ප්‍රදේශයට ආසන්න ප්‍රවේශය සහිතව නිවසක් ලෙස භාවිතා කළ එකී සහාධිපත්‍ය ඒකකට මායිම් උතුරට : මෙම ඒකකය CE3ට ඉහළ ප්‍රදේශයෙන් වෙන් කරන බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම ඒකක C/G 11න් වෙන් කරන බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම ඒකකය CE1ට ඉහළ ප්‍රදේශයෙන් වෙන් කරන බිත්තියේ මධ්‍යය හා C/G11 ඒකකය ද, බස්නාහිරට : මෙම ඒකකය C/G/9න් වෙන් කරන බිත්තියේ මධ්‍යය ද, ඉහළට පළමු මහලේ ගෙබිමේ මධ්‍ය ද, පහළට : මේ ඒකකයේ ගෙබිමේ මධ්‍යය ද, යන මායිම් තුළ පිහිටි වර්ග අඩි තුන්සිය හැත්තෑවක (ව. අ. 370) විශාල ඉහත කී සහාධිපත්‍ය ඒකකය වන අතර එය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ConA/59/22 වෙළුමේ පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඊට පහත විස්තර කරනු ලබන පොදු අංගෝපාංග භාවිතා කිරීමේ අයිතිය ද සමග ය.

පොදු අංගෝපාංග :

1. ගොඩනැගිල්ල තිබෙන ඉඩම,
2. ගොඩනැගිල්ලේ අත්තිවාරම් කුළුණු, මහා බාල්ක, බාල්ක, රූකුල් ප්‍රධාන බිත්ති සහ පියසි,
3. විදුලිය, දුරකථන, වතුර පයිප්ප, වතුර ටැංකි, පොම්ප අපවහන නල, මැන්හෝල්, කැළි කසළ සහ කැළිකසළ ඉවත් කිරීම වැනි එහි ප්‍රධාන සේවාවන් සඳහා සවිකිරීම්,
4. දේපළෙහි පැවැත්ම නඩත්තුවට සහ ආරක්ෂාවට අවශ්‍ය හෝ පහසු හෝ සාමාන්‍යයෙන් පොදුවේ පාවිච්චි කරන දේපළෙහි අන් සියළු කොටස් හා පහසුකම් ආදිය වේ.
5. (අ) බිම් මහලේ සැලැස්ම-
   CE4 සහ CE5 ලෙස ලකුණු කළ කැළි කසළ ඉවතලන සවිකිරීම්, CE4 සහ CE5 ලෙස ලකුණු කළ තරප්පු CE3 ලෙස ලකුණු කළ විවෘත ආලින්දය, CE1 සහ CE2 ලෙස ලකුණු කළ එම ඉඩමේම ඉතිරි කොටස,
   (ආ) පළමු මහලේ සැලැස්ම-
   CE4 සහ CE5 ලෙස ලකුණු කළ කැළි කසළ ඉවතලන සවිකිරීම්, CE4සහ CE5 ලෙස ලකුණු කළ තරප්පු CE7 ලෙස ලකුණු කළ විවෘත ආලින්දය,
   (ඇ) දෙවන මහලේ සැලැස්ම-
   CE4 සහ CE5 ලෙස ලකුණු කළ කැළි කසළ ඉවතලන සවිකිරීම් CE4 සහ CE5 ලෙස ලකුණු කළ තරප්පු CE8 ලෙස ලකුණු කළ විවෘත ආලින්දය,
   (ඈ) තෙවන මහලේ සැලැස්ම-
   CE4 සහ CE5 ලෙස ලකුණු කළ කැළි කසළ ඉවතලන සවිකිරීම් CE9 ලෙස ලකුණු කළ විවෘත ආලින්දය,
   (ඉ) හතරවැනි මහලේ සැලැස්ම-
   CE4 සහ CE5 ලෙස ලකුණු කළ කැළි කසළ ඉවතලන සවිකිරීම් CE4 සහ CE5 ලෙස ලකුණු කළ තරප්පු CE10 ලෙස ලකුණු කළ විවෘත ආලින්දය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්,

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

04-127/3

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ

(විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 322 හා 2005 මාර්තු මස 16 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පොළොන්නරුවේ කැළුම් පුබුදු ආරියවංශ සූරියආරච්චි විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 322 දරන උකස් බැඳුම්කරය මත එකී පුබුදු ආරියවංශ සූරියආරච්චි යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තුන්ලක්ෂ පනස් එක් දහස් හත්සිය හතලිස් හතකුත් ශත අනූහයක (රු. 3,51,747.96) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙලක්ෂ හැටහතර දහස් නවසිය විසිතුනක් (රු. 2,64,923) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තුන්ලක්ෂ පනස් එක් දහස් හත්සිය හතලිස් හතකුත් ශත අනූහයක (රු. 3,51,747.96) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙලක්ෂ හැටහතර දහස් නවසිය විසිතුනක් (රු. 2,64,923) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගනන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියළු මුදල් හා දරා ඇති සියළු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 322 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 322 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ, පොළොන්නරුව නගර සීමාව ඇතුළත, අංක 6 තෝපාවැව නාගරික කොට්ඨාසයේ, තෝපාවැව පිහිටි, ගලේවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 4187 හා 1981 අප්‍රේල් මස 24 වැනි දින දරන පිඹුරේ, ලොට් අංක 10 සහ 11 ඒකාබද්ධ කිරීමක් වන, බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ විසින් මැන සාදන ලද අංක 1279/4/1 හා 2003 දෙසැම්බර් මස 23 වැනි දින දරන පිඹුරේ, ලොට් අංක 4 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : අංක 4187 පිඹුරේ ලොට් අංක 15 (සුදර්ශන මාවත) ද, නැගෙනහිරට : අංක 4187 පිඹුරේ ලොට් අංක 12. 13 සහ 14 ද, දකුණට : ගලේවත්ත ලොට් "ඊ" දරන බිම් කට්ටිය ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩී. මුදුන්කොත්ගේ විසින් මැන සාදන ලද අංක 1263 දරන පිඹුරේ ලොට් "ඒ" දරන බිම් කට්ටිය ද යන මායිම් ඇතුළත පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියළු දේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-154/3

---

**සෙලාන් බැංකුව පී.එල්.සී - අනුරාධපුරය ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0210-02359020-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 මැයි මස 12 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් චාන්දනී මායාදුන්න විසින් සහතික කරන ලද 1998 ජූලි මස 22 වැනි දිනැති අංක 614 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම අනුරාධපුරය පදිංචි වාසල මුදියන්සේලාගේ ලීලාරත්න මුදියන්නේගම යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දොලොස් ලක්ෂ හැටදෙදහස් නවසිය අනූ හයයි ශත පහක් (රු. 12,62,996.05) මුදලක්, 2007 ජුනි මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 12,62,996.05ක මුදල ද, 2007 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 614 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, බටහිර හතලිස් පහ කෝරළේ, මීගලාව පිහිටි මිනුම්පති විසින් මීගලාව නමින් ඔහුගේ භාරයේ තබා ගෙන ඇති මිනුම්පති විසින් සාදන ලද FP19 හි තු මු පි 29හි පෙන්නුම් කරනු ලබන ලොට් 1336 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1317 ද, නැගෙනහිරට : ලොට් 1337 ද, දකුණට : ලොට් 1341 සහ බස්නාහිරට : ලොට් 1335 යන මායිම් තුළ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි දෙකක් (හෙක්ටයාර් 0.022) ක් විශාල ඉඩම. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව එච් 22/37හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

04-144/7

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 පෙබරවාරි මස 11 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජේපාල දීගොඩ ගමගේ විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 5421 සහ 2007 ජනවාරි මස 19 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) මහරගම, පමුණුව පාර, අංක 72බී දරන ස්ථානයේ පදිංචි රාජපක්ෂ පේලිගේ දමයන්ති, බ්‍රාහ්මණගේ කිංස්ලි නිශාන්ත පෙරේරා සහ පාඩිගමගේ පියසීලි යන අය විසින් ලබාගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම් සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරුවන් විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ, අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.12.26 වැනි දිනට රුපියල් එක්කෝටි තිස්හයලක්ෂ පනස්හත්දහස් හත්සිය හැටතුනකුත් ශත පහක මුදලක් (රු. 1,36,57,763.05) වර්තමානයේදී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින් බැවින් ද,

ඉහත කී රුපියල් එක්කෝටි තිස්හයලක්ෂ පනස්හත්දහස් හත්සිය හැටතුනකුත් ශත පහක මුදලක් (රු. 1,36,57,763.05) සහ 2008.12.26 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වශයෙන් රුපියල් එක්කෝටි විසිහත්ලක්ෂ හයදහස් හැටපහකුත් ශත අනූදෙකක මුදල (රු. 1,27,06,065.92) මත 2008.12.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 24% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම් ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව ඇතුළත පමුණුව ගමේ පිහිටි මහරගම පමුණුව පාරේ, වරිපනම් අංක 27/බී දරන මඩතියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1397 සහ 2006 නොවැම්බර් මස 22 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1 දරන බිම් කොටසට මායිම්, උතුරට : මහරගම පමුණුව පාරේ වරිපනම් අංක 72 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : මහරගම පමුණුව පාරේ වරිපනම් අංක 62/ C දරන පරිශ්‍රය ද, දකුණට : පාර ද, බස්නාහිරට : පාර සහ මහරගම පමුණුව පාරේ වරිපනම් අංක 72/C දරන පරිශ්‍රය ද යන මායිම් තුළ පිහිටි ඉහත සඳහන් අංක 1397 දරන පිඹුර අනුව පර්චස් දහතුනයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 13.25) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි සහ සෑම සියළු දේත් සමග ය.

තවද පහත දැක්වෙන ඉඩමෙන් බඩු පටවාගෙන හෝ නොමැතිව පයින් ගමන් කිරීම, වාහන වලින් ගමන් කිරීම, විදුලි රැහැන් ඇදීම, දුරකතන රැහැන් ඇදීම, ජලනළ හා ජලාපවහන නළ එලීම සහ වෙනත් පහසුකම් ආදී සියළු කටයුතු සඳහා යොදා ගැනීමේ මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් කළ පමුණුව ගමේ පිහිටි මඩතියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 592 සහ 1993 මැයි මස 07 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් A2E (අඩි 10 ක් පළල පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම් උතුරට : පමුණුව පාර් වරිපනම් අංක 146/1 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : පමුණුව පාරේ වරිපනම් අංක 146/1 දරන පරිශ්‍රය සහ ලොට් A2D ද, දකුණට : අංක 592 දරන පිඹුරේ ලොට් A2D, A2C, A2B සහ A2A ද, බස්නාහිරට : ලොට් A2C, A2 B, A2A සහ පමුණුව පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත සඳහන් අංක 592 දරන පිඹුර අනුව පර්චස් අටයි දශම පහයි නවයක (අ. 0. රූ. 0, පර්. 8.59) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ලය.

ඉහත කී ලොට් 1 පහත සඳහන් ඉඩමේ නැවත මැන බෙදා වෙන් කිරීමක් වේ.

ඉහත සඳහන් පමුණුව ගමේ පිහිටි මහරගම පමුණුව පාරේ, වරිපනම් අංක 72/ B දරන මඩිතියගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 592 සහ 1993 මැයි මස 07 දිනැති පිඹුරු ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් A2D නමැති බිම් කොටසට මායිම්, උතුරට : පමුණුව පාරේ වරිපනම් අංක 146/1 දරන පරිශ්‍රය සහ

ලොට් A2C සහ ලොට් A2E ද, නැගෙනහිරට : පමුණුව පාරේ වරිපනම් අංක 146/1 දරන පරිශ්‍රය සහ ඩබ්ලිව්. සීමන් අයිතිවාසිකම් කියන ඉඩම ද, දකුණට : පාර ද, බස්නාහිරට : පාර සහ ලොට් A2C සහ A2E ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 592 දරන පිඹුර අනුව පර්චස් දහතුනයි දශම දෙකයි පහක (අ. 0. රූ. 0, පර්. 13.25) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි සහ සෑම සියලු දේත් සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

04-127/2

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 පෙබරවාරි මස 11 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 514 සහ 2006 මැයි මස 30 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) කිඹුලාපිටිය, රුක්අත්තන හංදිය උළුඅම්බලම්වත්ත, අංක 212/117 දරන ස්ථානයේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ හසිත බණ්ඩාර යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ, අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කර මත 2008.12.26 වැනි දිනට රුපියල් දසලක්ෂ හතලිස්හයදහස් නවසිය හැත්තෑඑකකුත් ශත තිස්හතක මුදලක් (රු. 10,46,971.37) වර්තමානයේදී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින් බැවින් ද,

ඉහත කී රුපියල් දසලක්ෂ හතලිස්හයදහස් නවසිය හැත්තෑඑකකුත් ශත තිස්හතක මුදලක් (රු. 10,46,971.37) සහ 2008.12.26 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වශයෙන් රුපියල් නවලක්ෂ අනූතුන්දහස් තුන්සිය විසිහතරක මුදල (රු. 9,93,324) මත 2008.12.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 22.13% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රයඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, උඩුගහපත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත නඹදලුව ගමේ පිහිටි දඹුගහලන්ද හෙවත් දඹුගහවත්ත හෙවත් මිල්ලගහහේන හෙවත් දොඹගහලන්ද හෙවත් දොඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද අංක 8355 සහ 2002 ජූලි මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාර දරන බෙදා වෙන් කළ ලොට් 2 බිම් කොටසට මායිම්, උතුරට : ජේ. පී. ඔබේසේකරගේ ඉඩම ද, නැගෙනහිරට : එම පිඹුරේම ලොට් 3 ද, දකුණට : පොල්හේන පාර ද, බස්නාහිරට : එම පිඹුරේම ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අ. 0. රූ. 0, පර්. 20) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F264/55 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

04-127/1

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ.

අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 698 හා 2007 මාර්තු මස 28 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පොළොන්නරුව, බැමිණිවත්ත ආරච්චිලාගේ බන්දුල ශිරෝමන් නොහොත් බැමිණිවත්ත ආරච්චිලාගේ බන්දුල ශිරෝමන් බැමිණිවත්ත යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 698 දරන උකස් බැඳුම්කරය මත එකී බැමිණිවත්ත ආරච්චිලාගේ බන්දුල ශිරෝමන් නොහොත් බැමිණිවත්ත ආරච්චිලාගේ බන්දුල ශිරෝමන් බැමිණිවත්ත යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් නවදහස් නවසිය හැටකුත් ශත තිස් හතරක (රු. 9,09,960.34) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ තිස්හය දහස් හයසිය හැටපහක් (රු. 7,36,665) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් නවලක්ෂ නවදහස් නවසිය හැටකුත් ශත තිස් හතරක (රු. 9,09,960.34) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ තිස්හය දහස් හයසිය හැටපහක් (රු. 7,36,665) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතියකට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 698 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 698 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, පොළොන්නරුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පත්තුවේ, පෙළොන්නරුවේ පිහිටි "තෝපාවැව වත්ත" නමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයා සහතික කළ අංක එෆ්. එස්. පී. 3950 දරන පිඹුරේ ලොට් අංක 131හි කොටසක් වන බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. පියසේන විසින් මැන සාදන ලද අංක 167/05/2005 හා 2005 ජූලි මස 17 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන උතුරට : අංක එෆ්. එස්. පී. 3950 දරන පිඹුරේ ලොට් අංක 131හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එෆ්. එස්. පී. 3950 පිඹුරේ ලොට් අංක 132 ද, බස්නාහිරට : එෆ්. එස්. පී. 3950 පිඹුරේ ලොට් අංක 133 ද යන මායිම් ඇතුළත රූඩ් එකකුත් පර්චස් දෙකක් (අ. 0, රූ. 1, පර්. 2) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-154/7

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මහනුවර ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක් වූ සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. බී. විජේරත්න විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2006.08.11 දින සහ අංක 1102 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නුවරපක්ෂගේ චමින්ද හෙළරුවන් සහ නුවරපක්ෂගේ ආරියදාස යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හතලිස්හත්දහස් දෙසිය පනස්නමයයි ශත දහනමය (රු. 4,47,259.19) ක මුදලක් 2008.07.31 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,47,259.19 ක මුදලට 2008.08.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1102 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

*උපලේඛනය*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පහතදුම්බර, උඩගම්පහ කෝරළේ, නට්ටරම්පොත පිහිටි ශ්‍රී නරේන්ද්‍රසිංහ කලාපුරය දරන ඉඩමට සර්වේ ජනරාල් විසින් සහිතක කරන ලද පී. පී. මහ 2965 දරන පිඹුරේ ලොට් අංක 34 දරන ඉඩම් කොටසට, උතුරට : ලොට් අංක 31න් ද, නැගෙනහිරට : ලොට් අංක 37 1/2න් ද, දකුණට : ලොට් අංක 35න් සහ

බස්නාහිරට : ලොට් අංක 32 සහ 33 න් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි බිංදුව (හෙක්ටයාර් 0.040)ක් විශාල ඉඩම සියළු දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එල්. ඩී. ඕ/ඊ/06/92/2005 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

04-147/1

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මොරටුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.02.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම් දූල්වලගේ උපුල් පුෂ්පවීර විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පී. එල්. සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. බී. එස්. පොන්සේකා විසින් ලියා සහතික කරන ලද අංක 3606 සහ 2008 අප්‍රේල් මස 29 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත 2009.02.25 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ හැට දෙදහස් එකසියය හැත්තෑ අටයි ශත අට (රු. 6,62,178.08ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක් රුපියල් හයලක්ෂ හතලිස් අට දහස් හාරසියය නමයයි ශත විසිපහ (රු. 6,48,409.25)ක මුදල මත 2009.01.30 දින සිට වර්ෂයකට 29% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්-

එකී අංක 3606 දරන උකස්කරය යටතේ අයවිය යුතු රුපියල් හයලක්ෂ හැට දෙදහස් එකසියය හැත්තෑ අටයි ශත අට (රු. 6,62,178.08) ක මුදල 2009.01.30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද, අයකර ගැනීම සඳහා බැංකුවට උස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාර අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, පලන්නොරුව පිහිටි බුලත්වැලහේන හෙවත් දූවේමූකලාන හෙවත් සිල්වර්වැලි නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද අංක 721 සහ 1991 අප්‍රේල් මස 15 වැනි දිනැති සැලැස්මේ ලොට් 23 කැබැල්ල වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද එකී සැලැස්ම ප්‍රකාරව උතුරට : ලොට් 24 ද, නැගෙනහිරට : ලොට් 28, දකුණට : ලොට් 22 සහ බස්නාහිරට : ලොට් 120 (අඩි 20ක් පළල පාර) යන මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම හය (අ. 0, රූ. 0, පර්. 13.6) ක් හෝ හෙක්ටයාර් 0.0344ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියල්ල ද වේ. හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 288/142හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 721 දරන සැලැස්මේ ලොට් 120 මත මාර්ග අයිතිය ද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

04-160/3

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.12.18 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඊ. එම්. යූ. එම්. කේ. රත්නායක විසින් සහතික කරන ලද 2007.02.28 දිනැති අංක 76 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.11.04 දින තෙක් පොළිය වශයෙන් රුපියල් අටලක්ෂ අසූහත් දහස් හයසිය අසූපහයි ශත හැටක (රු. 8,87,685.60) මුදලක් සමග රුපියල් අටලක්ෂ හතලිස් දෙදහස් හයසිය අසූහයයි ශත නවයක් (රු. 8,42,686.09) මත වසරකට සියයට දහඅට (18%) බැගින් පොළියක් ද, 2008.11.5 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මහනුවර (හරහා) අලුදෙණිය, අංක 67ඒ හි පදිංචි අරම්පත් මුදියන්සේලාගේ චාමිකර බණ්ඩාර අරම්පත් ගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 76 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී ඉහත "1"හි සඳහන් මුදල සමග ඉහත කී දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු වැඩිපුර පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකු වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24හි පදිංචි වෙන්දේසිකාරවරුන් වන ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397

අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත කෝරළේ, බටහිර තුම්පනේ, තුම්පනේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, අලුදෙණියේ, (නමුත් ඔප්පුවේ සඳහන්ව ඇත්තේ අලුදෙණිය දකුණ යනුවෙනි) පිහිටි කුරුකොහොතැන්නෙහේන නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. සූරියනාරායන් විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 21 දිනැති අංක 2006/82 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස සටහන් කොට විස්තර කොට දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 ඊසානදිගට : ඉලුකේවල සිට හතරලියද්ද දක්වා වූ පාරට වෙන්කළ කොටස ද, ගිණිකොණට : ලොට් 3 ද, නිරිතදිගට : පන්සලට අයිති පිංහේන (BSVP 19හි ලොට් 334හි කොටසක්) ද, වයඹට : ලොට් 1 ද මායිම්ව පර්චස් තිස්අටයි දශම තුනයි තුනක (අ. 0, රූ. 0, පර්. 38.33) වපසරියකින් යුක්තවන අතර එහි ඇති ගහකොළ සහ වෙනත් සියළු දේද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K333/230හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. ඩබ්. බණ්ඩාර,
කළමනාකරු.

ලංකා බැංකුව,
මාවතගම.

04-151

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.02.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

එනම් පයාගල උඩවත්තගේ ජයලත් සෙනෙහශාන්ත ප්‍රනාන්දු සහ මහමරක්කල පටබැඳිගේ වයෝමා ශාමාලි ඩයස් ප්‍රනාන්දු බන්ධනදායියන් වශයෙන් ද, පයාගල උඩවත්තගේ ජයලත් සෙනෙහශාන්ත උකස්කරු වශයෙන් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද 2006.06.12 දිනැති අංක 2102, 2007.06.18 දිනැති අංක 2367 සහ 2008.06.10 දිනැති අංක 2634 උකස්කරය මත ලැබිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2009.01.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන රුපියල් අසූහතර ලක්ෂ දහහතර දහස් නමසිය නමයයි ශත හැටපහ (රු. 84,14,909.65) ක මුදල සහ 2009.02.01 වැනි දින සිට රුපියල් අසූහතර ලක්ෂ දහහතර දහස් නවසිය නමයයි ශත හැටපහ (රු. 84,14,909.65) මුදල මත වර්ෂයකට 38% බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්

1. එකී අංක 2102, 2367 සහ 2634 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් අසූහතර ලක්ෂ දහහතර දහස් නමසිය නමයයි ශත හැටපහ (රු. 84,14,909.65) ක මුදල ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තාවූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, අංක 474හි පිහිටි ආර්. එස්. එම්. ඔක්ෂිනියර්ස් බලයලත් වෙන්දේසිකරු වන රංජිත එස්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

2. 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය පරිදි මෙම යෝජනා සම්මතය පිළිබඳව දැන්වීම පළ කිරීමට බැංකුවේ ණය අයකර ගැනීමේ කළමණාකරුට බලය පවරන ලෙස,

3. එකී වෙන්දේසිකරු සමග සාකච්ඡා කොට ඉහත කී වෙන්දේසිය සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කිරීමට ද ඒ අනුව 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය පරිදි එකී වෙන්දේසිය පිළිබඳව දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට ද බැංකුවේ ණය අයකර ගැනීමේ කළමණාකරුට බලය පවරන ලෙස,

4. බැංකුවේ කළමණාකාර අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක හෝ බැංකුවේ බලය පවරන ලද නිලධාරියකු විසින් විකිණීමේ දිනට පෙර 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 11 වැනි වගන්තිය පරිදි වික්ෂේපන මිල නියම කළ යුතු බව,

5. එකී වෙන්දේසියේදී බැංකුව නියෝජනය කිරීමට ද, වික්ෂේප මිලට හෝ ඉහත කී පරිදි බැංකුවට අයවිය යුතු මුදල්, වියදම් සහ අනෙකුත් ගාස්තුවලට ඉහළ මිලකට ලංසු තබන්නෙකු නොවුවහොත් බැංකුව වෙනුවෙන් ණය අයකර ගැනීමේ කළමණාකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හෝ කොල්ලුපිටිය ශාඛාවේ කළමනාකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු විසින් එකී ඉඩම නාමික මිලකට මිලදී ගත යුතු බවත්,

6. එවන් විකිණීමකින් පසුව එකී පනතේ 15 වැනි වගන්තිය පරිදි විකිණීමේ සහතිකය ලියා සහතික කළ යුතු බවත් බැංකුවේ ව්‍යවස්ථාවලිය පරිදි එකී විකිණීමේ සහතිකයේ මුද්‍රාව බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකකු විසින් හෝ ඕනෑම අධ්‍යක්ෂවරයකු සහ ලේකම් විසින් අත්සන් කළ යුතු බවත් ය.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ, ලක්ෂපතිය-කල්දෙමුල්ල කොට්ඨාස අංක 1 තුළ තෙලවල ගමෙහි පිහිටි දැනට ශාසනජෝති පාරේ වරිපනම් අංක 23 සහ 23/1 දරන ලේඩි කැතරින් බ්‍රයිව් නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් මැන සාදන ලද අංක 2241 සහ 1970.12.24 වැනි දින දරන දරන සැලැස්මේ ලොට් 1 සහ 2 දරන බිම් කැබලි ඒකාබද්ධ කොට යලි මැන බෙදා වෙන් කරන ලද) බලයලත් මිනින්දෝරු සී. ජීරසිංහ විසින් මැන සාදන ලද අංක 1671 සහ 1999.01.28 දිනැති සැලැස්මේ ලොට් අංක 3 වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉහත කී සැලැස්ම අනුව උතුරට : ලොට් 2, නැගෙනහිරට : තෙලවල පාරේ වරිපනම් අංක 27/21 දරන පරිශ්‍රය, දකුණට : තෙලවල පාර සහ බස්නාහිරට : ශාසනජෝති පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හය (අ. 0. රූ. 0, පර්. 12.6) ක් හෝ හෙක්ටයාර් 0.0319 විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේද සමග වේ. ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 238/193හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

04-160/2

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - ගම්පහ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයි විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.02.25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම් අනුර ෆාමසි (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් සහ ජයනි ජයරානි කුරුප්පුආරච්චි උකස්කරු වශයෙන් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. කේ. එන්. පී. විතාරණ විසින් ලියා සහතික කරන ලද අංක 8328 සහ 2006.12.12 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත 2009.01.15 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස් හයලක්ෂ පනස් පන් දහස් හයසිය තිහයි ශත අනූ දෙක (රු. 36,55,630.92) ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දොලොස් ලක්ෂ දෙදහස් හයසිය අසූ එකයි ශත පනහක (රු. 12,02,681.50) මුදල මත 2009.01.01 දින සිට වර්ෂයකට 38% බැගින් පොළිය ද, රුපියල් විසිඑක් ලක්ෂ පනස් හයදහස් දෙසීය හතලිහක (රු. 21,56,240) මුදල මත 2009.01.16 වැනි දින සිට වර්ෂයකට 31% බැගින් පොළිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්

එකී අංක 8328 දරන උකස්කරය යටතේ අයවිය යුතු රුපියල් තිස්හය ලක්ෂ පනස් පන් දහස් හයසිය තිහයි ශත අනූ දෙක (රු. 36,55,630.92) ක මුදල ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තාවූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### ඉහත සඳහන් උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, ගම්පහ ඉහළගම ගමෙහි පිහිටි කෝන්ගහවත්ත හෙවත් මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් මැන සාදන ලද අංක 1505 සහ 1999.12.27 වැනි දිනැති සැලැස්මේ ලොට් "ඒ " කැබැල්ල වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද එකී සැලැස්මේ ප්‍රකාරව උතුරට : පාර, නැගෙනහිරට : විජයරාම පාර, දකුණට : ලොට් බී සහ බස්නාහිරට : ලොට් බී යන මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම දෙකයි හය (අ. 0, රූ. 0, පර්. 12.26) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු ආදී සියල්ල ද වේ.

2 බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, ගම්පහ ඉහළගම ගමෙහි පිහිටි කෝන්ගහවත්ත හෙවත් මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. ඩී. ජේ. දිසානායක විසින් මැන සාදන ලද අංක 1505 සහ 1999.12.27 වැනි දිනැති සැලැස්මේ ලොට් "බී" කැබැල්ල වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කරන ලද එකී සැලැස්ම ප්‍රකාරව, උතුරට : අංක 109ඒ/83 සැලැස්මේ ලොට් බී2, පාර හ ලොට් ඒ, නැගෙනහිරට : ලොට් ඒ, විජයරාම පාර සහ එච්. පියසේනගේ සහ අනෙක් අයගේ ඉඩම ද, දකුණට : එච්. පියසේන සහ අනෙක් අයගේ ඉඩම සහ බස්නාහිරට : එච්. පියසේනටගේ ඉඩම සහ ලොට් බී1බී යන මායිම් තුළ පිහිටා ඇති ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම එකයි තුන (අ. 0. රූ. 0, පර්. 26.13) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියල්ල ද වේ.

ඉහත කී ලොට් "ඒ " සහ "බී" යන කැබලි එක්ව උතුරට : අංක 109ඒ/83 සැලැස්මේ ලොට් බී2 සහ පාර, නැගෙනහිරට : විජයරාම පාර, දකුණට : එච්. පියසේනගේ සහ අනෙක් අයගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් බී1බී යන මායිම් තුළ පිහිටා ඇති අතර ප්‍රමාණයෙන් පර්චස් තිස්අටයි දශම තුනයි නමය (අ. 0, රූ. 0, පර්. 38.39)ක් වන ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු ආදී සියල්ලද ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 430/162හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

04-160/1

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.10.16 වැනි දින පවත්වනලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

1. මහජන නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.03.24 දිනැති අංක 3680 හා 2005.12.21 දිනැති අංක 4590 දරන උකස් බැඳුම්කර මත මුල් මුදල හා 2008.08.26 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් දහසය ලක්ෂ අසූනවදහස් දෙසිය එකයි ශත පනස් අටක (රු.16,89,201.58) මුදලක් සමග රුපියල් පහලොස් ලක්ෂයක (රු.15,00,000) මුදලක් මත වසරකට සියයට විසිනවයයි දශම පහ (29.5%) බැගින් පොළියක්, 2008.08.27 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් අනුරාධපුර, අදියර II, ගොඩගේ මාවත, අංක 560/9 හි පදිංචි මලලසේකර කස්තුරිආරච්චිලාගේ අයිතන් ගුණතිලක මහතා, මලලසේකර කස්තුරි ආරච්චිලාගේ කුමුදු ගංගානි ගුණතිලක මහත්මිය සහ ළිඳමුල්ලගේ අසේල දිමුතු ප්‍රියදර්ශණ මහතා යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී අංක 3680 හා 4590 දරන බැඳුම්කර මත අයවිය යුතු ඉහත සඳහන් රුපියල් දහසය ලක්ෂ අසූනවදහස් දෙසිය එකයි ශත පනස් අටක (රු.16,89,201.58) මුදලක් සමග 2008.08.26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරන ලද මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්සල පාර හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියුස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාව පිළිබඳ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, අනුරාධපුර නව නගර ශාඛාවේ, කළමනාකරුට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම්පළාත නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ කනදරා කෝරලේ, අනුරාධපුර මහ නගර සභා සීමාවේ පිහිටි අනුරාධපුර නගරයේ අදියර II හි පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් සාදන ලද 2003.10.18 වැනි දින හා අංක 110 දරන පිඹුරෙහි ලොට් අංක 436/2 ලෙස දක්වා ඇති "වන්නියම්කුලම කැලේ" (කොටස) නමැති ඉඩම් කැබැල්ලට උතුරට F. U. P. (A) 3 හි ලොට් 441 සහ 446/1 ද මායිම්ව පර්චස් දහඅටයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 18.75) ප්‍රමාණයකින් යුත් ඉඩම සහ එහි ඇති ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි ඇතුලු සියලුදේද අයත්වේ. මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A392/276 යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. කේ. ජී. එම්. බණ්ඩාර,
කළමනාකරු.

ලංකා බැංකුව,
අනුරාධපුර නවනගර ශාඛාව.

04-150

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කළින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට පොළොන්නරුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් ලියා සහතික කරන ලද අංක 316 හා 2005 මාර්තු මස 02 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම සඳුන්පුර, පොල්වත්තේ ගෙදර කීර්තිසේන යන විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 316 දරන උකස් බැඳුම්කරය මත එකී පොල්වත්තේ ගෙදර කීර්තිසේනගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස් හතර ලක්ෂ තුන්දහස් දෙසීය පහකුත් ශත අසූ තුනක (රු. 34,03,205.83) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිලක්ෂ තිස්තුන්දහස් පන්සිය හැත්තෑ හතකුත් ශත තිස් එකක් (රු. 20,33,577.31) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහ (8.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස් හතර ලක්ෂ තුන්දහස් දෙසීය පහකුත් ශත අසූ තුනක (රු. 34,03,205.83) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිලක්ෂ තිස්තුන්දහස් පන්සිය හැත්තෑ හතකුත් ශත තිස් එකක් (රු. 20,33,577.31) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී.

ආර්.) වර්ෂයකට සියයට අටයි දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් මත ගනත් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක්, මීට අදාළ වාහනය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 316 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන වාහනය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 316 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

| *හඳුනාගැනීමේ අංකය* | *විස්තරය, වර්ගය, මෝස්තරය අ. බ. ප්‍රමාණය යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *නවතා තබන ස්ථානය* |
|---|---|---|---|---|
| එන්. ඊ. ජේ. කේ. 6850 | වර්ගය - ලංකා අශෝක් ලේලන්ඩ්<br>මෝස්තරය - වයිකිං<br>වාහන පන්තිය - මෝටර් කෝච්<br>සිලින්ඩර් ධාරිතාවය - 6540.00 සී. සී. | SWE 527665 | SWH 265046 | අංක 177, ලත් පඳුර, සඳුන්පුර, හෝ මෙම මෝටර් වාහනය නවතා තබනු ලැබිය හැකි ස්ථානයක් හෝ ස්ථාන |

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-154/5

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

කලින් පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2009.02.25 වන දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් සීමාසහිත සිනෙප්‍රෝ (පුද්ගලික) සමාගම විසින් කලින් පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ජී. කුරේ විසින් සහතික කරන ලද අංක 5598 සහ 2005 දෙසැම්බර් මස 06 දින දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් ;

(අ) 2008.06.30 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස් ලක්ෂ අනූ තුන් දහස් පන්සිය තිස් දෙකයි ශත හත (රු.30,93,532.07) ක මුදල සහ 2008.07.01 දින සිට රුපියල් තිස් ලක්ෂ අනූ තුන් දහස් පන්සිය තිස් දෙකයි ශත හත (රු. 30,93,532.07) ක මුදල මත වර්ෂයකට 38 % බැගින් පොලිය ද,

(ආ) 2009.07.21 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දහනම ලක්ෂ හතළිස් නම දහස් අටසිය හැත්තෑවයි ශත අනූ එක (රු.19,49,870.91) ක මුදල සහ 2008.07.22 දින සිට රුපියල් දහ අට ලක්ෂ තිස් තුන් දහස් දෙසීය (රු.18,33,200) ක මුදල වර්ෂයකට 29% බැගින් පොලිය ද,

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත් එකී අංක 5598 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් පනස් ලක්ෂ හතලිස් තුන් දහස් හාරසිය දෙකයි ශත අනූ අට (රු.50,43,402.98) ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලියද ගාස්තු ද එකී අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තාවූ ද, මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 හි පිහිටි ආර්. එස්. එම්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු වන රංජිත් එස්. මහානාම වෙත 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කලින් ගල්කිස්ස සහ දැනට නුගේගොඩ දෙල්කඳ ලියාපදිංචි කිරීමේ බලප්‍රදේශය තුළ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුල, රාවතාවත්ත පිහිටි ගාලු පාර වරිපනම් අංක 396 දරන කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ක්ලේමන්ට් එච්. ජී. ප්‍රනාන්දු විසින්

මැන සාදන ලද අංක 1070 සහ 1978 නොවැම්බර් මස 16 දින දරන සැලැස්මේ ලොට් C3 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉහතකී සැලැස්ම අනුව උතුරට : යූ. එල්. එම්. සිල්වාට අයත් ඉඩම, නැගෙනහිරට : පිවිසුම් මාර්ගය සහ ඩබ්ලිව්. ඒ. පර්ඩිනැන්ඩෝට අයත් ඉඩම, දකුණට : ඩී. ප්‍රනාන්දු, බී. ගෝමස් සහ ටී. ජේ. ජේ. පෙරේරාට අයත් ඉඩම් සහ බස්නාහිරට : ලොට් C2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිපහයි දශම තුනයි පහ (අ. 0, රූ. 0, පර්. 25.35) ක් විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ. ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සහ දැනට නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1212/89 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් C3 දරන ඉඩම් කැබැල්ල යලි මනින ලදුව බලයලත් මිණින්දෝරු ජෙරල්ඩ් ඒ. ද සිල්වා විසින් මැන සාදන ලද 2003 නොවැම්බර් මස 17 දිනැති අංක 2267 දරන සැලැස්ම අනුව පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත :-

බස්නාහිර පළාතේ, කලින් ගල්කිස්ස සහ දැනට නුගේගොඩ දෙල්කඳ ලියාපදිංචි කිරීමේ බල ප්‍රදේශය තුළ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුළ, රාවතාවත්ත පිහිටි කැටකැලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජෙරල්ඩ් ඒ ද සිල්වා විසින් මැන සාදන ලද අංක 2267 සහ 2003 නොවැම්බර් මස 17 දින දරන සැලැස්මේ දැක්වෙන බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඉහත කී සැලැස්ම අනුව උතුරට : ගාලු පාර වරිපනම් අංක 402 දරන පරිශ්‍රය, නැගෙනහිරට : පාර (ගාලු පාරේ සිට නිවාස වෙතට) සහ ගාලු පාර වරිපනම් අංක 404/6 දරන පරිශ්‍රය, දකුණට : ගාලු පාර වරිපනම් අංක 394/4 සහ 394/3 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : ගාලු පාර වරිපනම් අංක 396 පරිශ්‍රය (කොටසක්) සහ පාර (ගාලු පාරේ සිට) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිපහයි දශම තුනයි පහ (අ. 0, රූ. 0, පර්. 25.35) ක් විශාල බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ.

එකී අංක 1070 දරන සැලැස්මෙහි ලොට් සී 4 (අඩි 10 ක් පළල මාර්ගය සඳහා වෙන් කරන ලද) මත මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු- ණය අයකර ගැනීම්.

04-160/4

---

## ලංකා බැංකුව - අධිශ්‍රේණි ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2009.01.08 වෙනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී.

1. මහජන නොතාරිස් එම්. ටී. එම්. බාෆික් විසින් සහතික කරන ලද 2008.01.18 දිනැති අංක. 10301 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.07.11 දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිඑක් ලක්ෂ විසිඑක් දහස් හයසිය පහයි ශත පනස් හතරක (රු.21,21,605.54) මුදලක් සමග රුපියල් දහඅටලක්ෂ අසූහතර දහස් එකසිය පනහක (රු.18,84,150) මුදලක් මත වසරකට සියයට විසිපහ (25%) බැගින් පොලියක්ද, 2008.10.25 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පානදුර, අලුබෝමුල්ල, මැදවත්ත, ශාන්ති ගාඩ්න්ස් හි අංක 426 F1 හි පිහිටි සැලෝන් ඕපන් වීව් සහ ආයුර්වේදික් හර්බල්ස් ආයතනයෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක. 10301 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිඑක්ලක්ෂ විසිඑක් දහස් හයසිය පහයි ශත පනස් හතරක (රු. 21,21,605.54) මුදල සමග 2008.10.25 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට, කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දෙහි බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සීමා තුළ අලුබෝමුල්ලෙහි පිහිටි බෙලිගහවත්තෙහි ලොට් 2 නමැති ඉඩම සහ එහි ඇති ගහකොළ සහ වෙනත් සියළු දේද සහිතව, බලයලත් මිනින්දෝරු වයි. කේ. කොස්තා විසින් සාදන ලද 1997 අප්‍රේල් 12 දිනැති අංක 2253 දරන පිඹුරෙහි ලොට් 8 ලෙස දක්වා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 8 උතුරට : ලොට් 9 ද, නැගෙනහිරට : ලොට් 7 සහ 14 (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස)ද, දකුණට : ලොට් C සහ ද, B බස්නාහිරට : ලොට් 13 ද, මායිම්ව, පර්චස් පහළොවයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 15.5) ක වපසරියකින් යුක්තවන අතර, මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F329/240 හි ලියාපදිංචි කර ඇත.

ඒ සමගම මෙයට ඉහත කී අංක 2253 දරන පිඹුරෙහි ලොට් 14 ලෙස සටහන් කර ඇති පාරට වෙන්කළ කොටස (අඩි 15 ක් පළල) ද, භාවිතයට අයිතිය ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

2009 ජනවාරි මස 28 වැනි දින,
ලංකා බැංකුව,
පානදුර.

04-149

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියා පදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1750004024.
ණය ගිණුම් අංකය : 332323.

2008 ඔක්තෝබර් මස 22 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

අවිස්සාවේල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඕ. සී. ද ජේ. සෙනවිරත්න විසින් 2006 නොවැම්බර් මස 12 වන දින සහතික කරන ලද අංක 1772 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී) හි නමට ලියන ලද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමරරත්න මුහන්දිරම්ගේ චන්දන සහ ආන්දුගොඩ ඇහැලප ගමගේ මොනිකා ණයකරුවන්/උකස්කරු හැටියටද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් දෙලක්ෂ දහනව දහස් තුන්සිය තුනයි ශත විසි තුනක (රු. 42,19,303.23) මුදලක් 2008 මැයි මස 22 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හතලිස් දෙලක්ෂ දහනව දහස් තුන්සිය තුනයි ශත විසිතුනක (රු.42,19,303.23) මුදලට 2008 මැයි මස 23 වැනි සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 38,23,821.08ක මුදල මත 15.5% බැගින් වැඩිදුර වාර්ෂික පොලියද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 1772 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස්ඩොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක පී. එච්. පෙරේරා විසින් 1990 ජනවාරි මස 12 වන දින සාදන ලද අංක 1317 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු හේවාගම් කෝරලේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි කටුවානෙවත්ත කියන ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 7 දරන ඉඩමට මායිම් : උතුරට : අංක 896 දරන පිඹුරේ ලොට් 3 (ප්‍රගති මාවතේ වරිපනම් අංක 36 දරන පරිශ්‍රයේ කොටසක්) ද, නැගෙනහිරට : පිට ඇල ද, දකුණට : ප්‍රගති මාවතේ වරිපනම් අංක 34 දරන පරිශ්‍රයද, සහ බස්නාහිරට : ලොට් 1 සහ 6 ද, යන මායිම් තුළ පර්චස් දොලහක් (අ. 0, රූ. 0, පර්. 12) විශාල ඉඩම අංක 1317 දරන පිඹුර පරිදි හෝමාගම ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ පී 1690/169 වෙලුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

එකී අංක 1317 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කරන ලද පාරක් සඳහා වෙන් කරන ලද කොටස ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

04-123

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 22122 හා 2004.10.26 දින ද 22676 හා 2005.05.05 දින ද 24257 හා 2006.09.22 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, "ඉන්ද්‍රජිත් ඩිස්ට්‍රිබියුටර්ස්" ලැබිය යන නාමය අභිධානය හා ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස මාකේවිට ව්‍යාපාරය කරගෙන යන, මාකේවිට, කත්තොට රාලලාගේ ඉන්ද්‍රජිත් සිරිමෙවන් සන්දනායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 නොවැම්බර් 30 වන දිනට ඉහත කී අංක 22122, 22676 හා 24257 යන උකස් බැඳුම්කර මත එකී කත්තොට රාලලාගේ ඉන්ද්‍රජිත් සිරිමෙවන් සන්දනායකගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හතළිස්පන් ලක්ෂ හතළිස් අටදහස් තුන්සිය අසූ තුනකුත් ශත හැත්තෑ නවයක (රු.45,48,383.79) මුදලක් සහ 2008 දෙසැම්බර් 01 වෙනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ හතළිස් දහස් අටසිය හයකුත් ශත අසූවක් (රු.9,40,806.80) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද රුපියල් තිස් ලක්ෂ හැත්තෑ එක් දහස් අටසිය විසිතුනක් (රු. 30,71,823) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්. වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හතළිස්පන් ලක්ෂ හතළිස් අටදහස් තුන්සිය අසූ තුනකුත් ශත හැත්තෑ නවයක (රු.45,48,383.79) මුදලක් සහ 2008 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ හතළිස් දහස් අටසිය හයකුත් ශත අසූවක් (රු.9,40,806.80) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද රුපියල් තිස් ලක්ෂ හැත්තෑ එක් දහස් අටසිය විසිතුනක් (රු.30,71,823) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකය (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටස් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 22122, 22676 හා 24257 දරන උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 22122, 22676 හා 24257 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ

සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 22122, 22676 හා 24257 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත තම්මිට ග්‍රාමයේ පිහිටි "කොස්ගහලන්ද" නොහොත් කොස්ගහවත්ත ලොට් අංක 1 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද අංක 3349 හා 2002.06.27 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම් උතුරට : ටී. ජයසිංහට අයිති ඉඩම ද, නැගෙනහිරට : එන්. ඒ. සිරිනෙල්ට, එන්. ඒ. සද්ධාතිස්ස සහ එන්. ඒ. ජයසේකරට අයිති ඉඩම් ද, දකුණට : තම්මිට පාර ද, බස්නාහිරට : පාර සහ ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 3349 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකකුත් පර්චස් තිස් හතරයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 2, පර්. 34.25) නොහොත් හෙක්ටයාර 0.2889 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

04-153

---

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.02.25 වන දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම් මහතලගේ ගයාන් රමේෂ් පීරිස් විසින් කලින් පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද 2005 ඔක්තෝබර් 19 දිනැති අංක 1797 සහ 2006 ජූලි 21 දිනැති අංක 2137 ඒ දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක්

(අ) 200.09.16 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැත්තෑ අට ලක්ෂ විසිහය දහස් එකසියය හතයි ශත පනස් හතර (රු. 7,826,107.54) ක මුදල සහ 2008.12.26 දින සිට රුපියල් හැත්තෑ තුන් ලක්ෂ විසිහත් දහස් තුන්සියය හැට දෙකයි ශත හතළිස් එක (රු. 7,327,362.47) ක මුදල මත වර්ෂයකට 29% බැගින් පොළිය ද,

(ආ) 2009.01.16 වන දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දහඅට ලක්ෂ පනස් දෙදහස් තුන්සිය දහ හතයි ශත විසි හත (රු.1,852,317.72) ක මුදල සහ 2008.12.18 දින සිට රුපියල් දහහත් ලක්ෂ හතළිස් එක් දහස් හාරසියය අසූ හතයි ශත අනූ පහ (රු. 1,741,487.95) ක මුදල මත වර්ෂයකට 29% බැගින් පොළිය ද,

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින්ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේද යත් එකී අංක 1797 සදහ 2137 ඒ දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් අනූ හය ලක්ෂ හැත්තෑ අට දහස් හාරසිය විසි හතරයි ශත අසූ එක (රු. 9,678,424.81) ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දින දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද, එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූද, දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 හි පිහිටි ආර්. එස්. එම්. ඔක්ෂන්ස්හි බලයලත් වෙන්දේසිකරු වන රංජිත් එස් මහානාම වෙත 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස,

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, අංක 3206 දරන සහාධිපත්‍ය සැලැස්මේ ලොට් බී 1වශයෙන් දැක්වෙන ඉඩමේ ඉදිරිකරන ලද මහල් 24 කින් යුත් සහාධිපත්‍ය නිවාස ගොඩනැගිල්ලේ 15 වන මහලෙහි පිහිටි කොල්ලුපිටිය කොට්ඨාස අංක 37 කොල්ලුපිටියේ පිහිටි කොල්ලුපිටිය පාර වරිපනම් අංක 75-14/2 දරන බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වල විසින් මැන සාදන ලද අංක 3206 සහ 1999 අගෝස්තු මස 10 දින දරන සහාධිපත්‍ය සැලැස්මේ BA/F15/U6 ඒකකය වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඉහතකී සැලැස්ම අනුව උතුරට : මෙම ඒකකයේ බිත්තියේ පිටස්තර දාරය සහ සීඊ 1 ඒකකයට ඉහල මුහුණත, නැගෙනහිරට : මෙම ඒකකයේ බිත්තියේ පිටස්තර දාරය සහ සීඊ 1 ඒකකයට ඉහල මුහුණත, දකුණට : මෙම ඒකකයේ සහ BA/F15/U5 ඒකකය අතර බිත්තියෙහි මධ්‍යය සහ මෙම ඒකකයේ බිත්තියෙහි පිටස්තර දාරය සහ සීඊ 12 (පඩි පෙළ) බස්නාහිරට : මෙම ඒකකයේ බිත්තියේ පිටස්තර දාරය සහ සීඊ 31 ඒකකය (Foyer) සහ සීඊ 12 ඒකකය (පඩි පෙල) සහ මෙම ඒකකය සහ BA/F15/U7 ඒකකය අතර බිත්තියෙහි මධ්‍යය, ඉහළ මුදුන : මෙම ඒකකයේ සිවිලිමේ තලය සහ පහත මුදුන : මෙම ඒකකයේ පොළවේ තලය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් වර්ග අඩි 1245.00 ක් වූ ඒකකය.

එකී ඒකකයට අදාළව නියම කර ඇති වටිනාකම සියයට 0.6380.

බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩන්වල විසින් මැන සාදන ලද අංක 3207 සහ 1999 අගෝස්තු 13 දරන සැලැස්මේ ඒ3 දරන කැබැල්ල මත මාර්ග අයිතියද සමගින් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ණය අයකර ගැනීම්.

04-160/5

පීවී 60290.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඇබ්කෝ ජෝන් මුවර්ස් වර්ල්ඩ් කෙයා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.06.15 දින සංස්ථාපිත සමාගමක් වන ඇබ්කෝ ජෝන් මුවර්ස් වර්ල්ඩ් කෙයා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඇබ්කෝ ජෝන් මුවර්ස් වර්ල්ඩ් කෙයා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

04-130

---

පීවී 63375.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "මිනාරා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.03.11 දින සංස්ථාපිත සමාගමක් වන මිනාරා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, මිනාරා ට්‍රේඩිං(ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

04-131

---

පීවී 61259.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "එඩ්වඩ් රේමන්ඩ් (ප්‍රයිවට) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන පනතේ 2007.09.07 දින සංස්ථාපිත සමාගමක් වන එඩ්වඩ් රේමන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, එඩ්වඩ් රේමන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

04-128

---

පීවී 62683.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "මෙඩි ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.01.10 දින සංස්ථාපිත සමාගමක් වන මෙඩි ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතු වල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, මෙඩි ස්කෑන් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

04-129

ජීඑල් 2004.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "අර්බන් රෂ් සුපර්බයික් (ගරන්ටි) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන පනතේ 2007.08.07 දින සංස්ථාපිත සමාගමක් වන අර්බන් රෂ් සුපර්බයික් (ගරන්ටි) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, අර්බන් රෂ් සුපර්බයික් (ගරන්ටි) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ට්‍රරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

04-132

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1590000150.
ජේ. ඇන්ඩ්. සී. එන්ටර්ප්‍රයිසස්

2003 ජුනි මස 27 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. එස් ද සිල්වා විසින් සහතික කරන ලද්දා වූද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද, 1999 මාර්තු මස 03 වන දින හා අංක 791 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ජේ. ඇන්ඩ්. සී යන නාමය හා විලාශයෙන් හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කුරුකුලසූරිය මිරැන්ගරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆර්නැන්ඩු හෙවත් කුරුකුලසූරිය මිරැන්ගරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆර්නැන්ඩු සහ නානායක්කාර හෙට්ටිගේ විනිෆ්‍රඩ් කොන්සි පෙරේරා ණයකරුවන් හැටියට ද, සහ කුරුකුලසූරිය මිරැන්ගරලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆර්නැන්ඩු හෙවත් කුරුකුලසූරිය මිරැන්ගරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆර්නැන්ඩු උකස්කරු හැටියටද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ හතලිස් පන්දහස් නවසිය දහතුනයි ශත තිස්හත (රු. 945,913.37) ක මුදලක් 2003 මැයි මස 29 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් නවලක්ෂ හතලිස් පන්දහස් නවසිය දහතුනයි ශත තිස්හත (රු. 945,913.37) ක මුදලට 2003 මැයි මස 30 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට 30%ක වැඩිදුර වාර්ෂික පොළියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 791 දරන උකස් බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් ලිමිටඩ් වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

**උපලේඛනය**

බලයලත් මානක පී. විතාන විසින් 1995 මැයි මස 20 වන දින සාදන ලද අංක 634 ඒ දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු සල්පිටි කෝරළේ (මොරටුමුල්ල අංක 9 ජන්ද කොට්ඨාසයේ) මොරටුවැල්ල පිහිටි ප්‍රධාන මාර්ගයේ වරිපනම් අංක 71/2 සහ වරිපනම් අංක 39 දරන බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : දුම්රිය පොල පාරද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 2 ද, සහ බස්නාහිරට : ශාන්ත සෙබස්තියන් දේවස්ථානයට හිමි දේපළ ද යන මායිම් තුළ පර්චස් හයයි දශම එකයි පහක් (අ. 0, රූ. 0. පර්. 6.15) ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටස ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2320/91 යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

04-136

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 92557

අධ්‍යක්ෂ මණ්ඩලය : වෙතට
පාලන අධ්‍යක්ෂ : වෙතින්

කාරණය : ජේ. ඇන්ඩ් සී එන්ටර්ප්‍රයිසස්
හවුල්කරුවන් : කුරුකුලසූරිය මිරැන්ගරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් fපර්නැන්ඩු මහතා නානායක්කාර හෙට්ටිගේ විනිfප්‍රිඩා කොන්සි පෙරේරා මහත්මිය ඉකුත් වූ හිඟ අත්තිකාරම් මුදල - මොරටුව ශාඛාව

ජේ ඇන්ඩ් සී එන්ටර්ප්‍රයිසස් වෙත සපයන ලද පහසුකම්

| පහසුකම් | ප්‍රදානය කල මුදල රු. | ප්‍රදානය කල දිනය | හිඟව ඇති මුදල 2003.05.29 වන දිනය වන විට (රු.) | හිඟ පොලී අනුපාතය (රු.) |
|---|---|---|---|---|
| අයිරාව | 300,000 | 27.10.2000 | 945,913.37 | 30% වසරකට |

පොලී අය බද්ද අත්හිටුවීම : රුපියල් : 327,709.13
ඇපය : මූලික බැඳුම්කරය දේපල සම්බන්ධයෙන් රුපියල් මිලියන 2.7 වරිපනම් අංක 71/2, කෙලින් වීදිය. මොරටුව (ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 6.15) 2000 මාර්තු මස 16 වන දින කේ. ඒ. පෙරේරා විසින් තක්සේරු කරන ලදී.
බල කරන ලද විකිණීමේ වටිනාකම : රු. 4,000,000
වෙළඳ වටිනාකම : රු. 4,165,000

කේ. එම්. ජේ. එම්. පර්නැන්ඩු මහතාගේ සහ එන්. එච්. ඩබ්ලිව්. සී. පෙරේරා මහත්මියගේ නම් ඒකාබද්ධ කොට දෙන ලද ප්‍රදානයේ පහසුකම් සපයන ලදී.

| පහසුකම් | ප්‍රදානය කල මුදල රු. | ප්‍රදානය කල දිනය | හිඟව ඇති මුදල 2003.05.29 වන දිනය වන විට (රු.) | හිඟ පොලී අනුපාතය (රු.) |
|---|---|---|---|---|
| නිවහන නිවාස ණය | 2,600,000 | 2000.09.26 | 2,535,149.99 | 1,103,090.82 වසරකට 30% |

ඉහත සඳහන් කරන ලද දේපල සඳහා දෙවැනි උකස රුපියල් මිලියන 2.6

විස්තරය :

1998 දෙසැම්බර් මස සිට ණයකරුවන් බැංකුව සමග ගනුදෙනු අරඹා ඇත. 1999 පෙබරවාරි මස සිට ඔවුන්ට බොහෝ පහසුකම් සපයා ඇත. 2000 වර්ෂය අග භාගයේදී (කුකුළු සහ වෙනත් නිෂ්පාදන නිසා) භෝජන ශාලාවලට ණයට දීම නිසා පාඩු විඳීමට ද සිදුවිය.

ණය දීමේදී ඇපකරුවන් නොමැතිවීම නිසා කුකුළු නිෂ්පාදන අඩු වීමෙන් විශාල පාඩුවක් සිදුවිය. බැංකු පහසුකම් පිරිමැසීමට ග්‍රොසරි ව්‍යාපාරයෙන් සෑහෙන ආදායමක් නොලැබීම නිසා මෙසේ සිදුවිය. ඒ නිසා බැංකු පහසුකම් 2000 ඔක්තෝබර් මාසයේදී නැවත උපලේඛන ගතකරන ලදී.

බරපතල අලාභ සිදුවීම නිසා ග්‍රොසරි සේවය වසා දමන ලදී. අනතුරුව විදුලි උපාංග අළුත්වැඩියා කිරීම ආරම්භ කරන ලදී. මෙයිනුත් බැංකු ගනුදෙනු පියවීමට තරම් ආදායමක් නොලැබේ. මේ හේතුව නිසා 1990 අංක 04 දරන (විශේෂ විධිවිධාන) පනතේ නියෝග අනුව බැංකු මගින් දෙන ලද ණය අයකර ගැනීම සඳහා උකස් කරන ලද දේපල වෙන්දේසි පියවර ගනු ලැබේ.

ආයතනයට සපයන ලද පහසුකම් සම්බන්ධයෙන් වෙන් වශයෙන් සම්මුති දෙකක් සාදා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ කොටස් කරුවන්ට අවසර දෙනු ලැබේ.

දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරනු ලැබේ.

එකී නියෝගයේ II වන ඡේදය අනුව ලංසු තැබීමට නියෝග කරනු ඇත. බැංකුවට මිස අන් අයට දේපල විකිණිය නොහැක. බල කරන ලද විකිණීමේ වටිනාකම අනුව රු. 4,000,000 ලංසුව තැබීම සුදුසු බවට තීරණය කරනු ලැබේ. ඊට පහත සඳහන් සම්මුතිය එකතු කිරීම අවශ්‍ය වේ.

ජේ. ඇන්ඩ්. සී. එන්ටර්ප්‍රයිසස් ආයතනයට දෙන ලද පහසුකම් සම්මුතියේ අඩංගු විය යුතුය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එන්. එන්. ද සිල්වා විසින් 1999 මාර්තු මස 3 වන දින සහතික කරන ලද්දාවූද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී.) හි නමට ලියන ලද්දාවූද. අංක 791 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජේ. ඇන්ඩ්. සී. එන්ටර්ප්‍රයිසස් යන නාමය සහ විලාශයෙන් හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කුරුකුලසූරිය මිරැන්නරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් fපර්නැන්ඩු හෙවත් කුරුකුලසූරිය මිරැන්ගෙරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් fපර්නැන්ඩු සහ නානායක්කාර හෙට්ටිගේ විනිfප්‍රඩ් කොන්සි පෙරේරා ණයකරුවන් හැටියට ද, සහ කුරුකුලසූරිය මිරැන්නරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් fපර්නැන්ඩු හෙවත් කුරුකුලසූරිය

මිරැන්ගරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆ්පර්නැන්ඩු උකස්කරු හැටියටද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවසිය හතලිස් පන්දහස් නවසිය දහතුනයි ශත තිස් හතක (රු. 945,913.37) මුදලක් 2003 මැයි මස 29 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් නවසිය හතලිස් පන්දහස් නවසිය දහතුනයි ශත තිස් හතක (රු. 945,913.37) මුදලට 2003 මැයි මස 30 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රු. 945,913.37 ක මුදල මත 30% ක වැඩිදුර වාර්ෂික පොලියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩු කොට එකී අංක 791 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස් ඩොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක පී. විතාන විසින් 1995 මැයි මස 20 වන දින සාදන ලද අංක 634 ඒ දරන පිඹුර පරිදි, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලෙපත්තු සල්පිටි කෝරලේ, (මොරටුවැල්ල ඡන්ද කොට්ඨාස අංක 9) මොරටුමුල්ල පිහිටි වරිපනම් අංක 71/2 මහවීදිය සහ වරිපනම් අංක 39 දරන බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩමට මායිම් :- උතුරට : දුම්රිය පාරද නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට : ශාන්ත සෙබස්තියන් පල්ලියට අයිති දේපල ද, යන මායිම් තුල පර්චස් හයයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 6.15) විශාල ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2320/91 යටතේ ලියාපදිංචිව ඇත.

කේ. එම්. ජේ. එම්. ෆ්පර්නැන්ඩුට සහ එන්. එච්. ඩබ්ලිව්. සී. පෙරේරා මහත්මියට දෙන ලද පහසුකම් සම්බන්ධව සම්මුතියට ඇතුලත්විය යුතු කරුණු

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් සහතික 2000 සැප්තැම්බර් මස 27 වන දින සහතික කරන ලද්දාවූද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී) හි නමට ලියන ලද්දාවූද, අංක 821 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුරුකුලසූරිය මිරැන්නරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆ්පර්නැන්ඩු හෙවත් කුරුකුලසූරිය මිරැන්ගරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆ්පර්නැන්ඩු සහ නානායක්කාර හෙට්ටිගේ විනිෆ්‍රඩ් කොන්සි පෙරේරා ණයකරුවන් හැටියට ද, සහ කුරුකුලසූරිය මිරැන්නරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆ්පර්නැන්ඩු හෙවත් කුරුකුලසූරිය මිරැන්ගරාලලාගේ ජෝෂප් මැක්සිමිලියන් ෆ්පර්නැන්ඩු උකස්කරු හැටියටද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන් මිලියන හයසිය තිස්අට දහස් දෙසීය හතලිහයි ශත අසූ එකක මුදලක් (රු. 3,638,240.81) මුදලක් 2003 මැයි මස 29 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තුන් මිලියන හයසිය තිස්අට දහස් දෙසීය හතලිහයි ශත අසූ එකක (රු.3,638,240.81) මුදලට 2003 මැයි මස 30 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රු. 2,535,149.99 ක මුදල මත 30% ක වැඩිදුර වාර්ෂික පොලියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 821 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස්ඩොප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බලයලත් මානක පී. විතාන විසින් 1995 මැයි මස 20 වන දින සාදන ලද අංක 634 ඒ දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු සල්පිටි කෝරළේ (මොරටුවැල්ල අංක 9 ඡන්ද කොට්ඨාසය) මොරටුවැල්ල පිහිටි මහවීදියේ වරිපනම් අංක 71/2 සහ වරිපනම් අංක 39 දරන බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන කොටසට මායිම් : උතුරට : දුම්රිය පාරද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරට : ශාන්ත සෙබස්තියන් පල්ලියට හිමි දේපලද, යන මායිම් තුල පර්චස් හයයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 6.15) විශාල ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2320/91 යටතේ ලියාපදිංචිව ඇත.

කළමනාකාර අධ්‍යක්ෂ.

2003 ජූනි මස 9 වැනි දින.

04-122

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | | රු. ශ. |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡෙදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡෙදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡෙදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡෙද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡෙදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡෙදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡෙදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡෙද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2009**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| අප්‍රේල් | 2009.04.03 | සිකුරාදා | 2008.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.08 | බදාදා | 2008.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.17 | සිකුරාදා | 2009.04.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.04.24 | සිකුරාදා | 2009.04.08 | බදාදා | දහවල් | 12.00 |
| | 2009.04.30 | බ්‍රහස්පතින්දා | 2009.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| මැයි | 2009.05.07 | බ්‍රහස්පතින්දා | 2009.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.05.15 | සිකුරාදා | 2009.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.05.22 | සිකුරාදා | 2009.05.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2009.05.29 | සිකුරාදා | 2009.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2009.06.05 | සිකුරාදා | 2009.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.12 | සිකුරාදා | 2009.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.19 | සිකුරාදා | 2009.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.06.26 | සිකුරාදා | 2009.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.